මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

වැය ශීර්ෂ අංකය 298

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

CM 040872 - 20 (2024/08) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂතුමාගේ නිවේදනය

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඔබ වෙත සාදරයෙන් පිළිගන්වමු. 2023 වර්ෂය අභ්‍යන්තර අර්බුද රැසක නිමාව සමඟ පැමිණි නව වර්ෂයක් වූ අතර, දෙපාර්තමේන්තුවේ බොහෝ අරමුණුවල සංක්‍රාන්තික වෙනසක් හා ප්‍රගතියක් අපේක්ෂිත කාලපරිච්ඡේදයක් විය. ආර්ථික අර්බුද තත්ත්වය සමනයට අදාළ රාජ්‍ය වියදම් කළමනාකරණ මාර්ගෝපදේශ අනුව යමින් මිනුම් විද්‍යාව හා සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් ශක්තිමත් කරමින් අඛණ්ඩව නව්‍යකරණයන් සිදු කළ යුතු විය. අපි අපගේ ක්‍රියාමාර්ග සහ මෙහෙයුම් විධිමත් කළ අතර එම කැපවීම ශක්තිමත් භෞතික හා මූල්‍ය ප්‍රගතියකට දායක විය. අපගේ දැක්ම වන්නේ ''මනා ලෙස සුරැකි පාරිභෝගික ප්‍රජාවක් සඳහා නිවැරදි හා විශ්වසනීය මිනුම්'' ලබා දීමයි. අප මේ වන විට දළ වශයෙන් රුපියල් මිලියන 400ක වාර්ෂික ඉපැයීම් සහිත ආයතනයක් වන අතර 370 කට ආසන්න විනයගරුක හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයකින්ද සමන්විතය.

වෙනත් ඕනෑම රටක මෙන්, ශ්‍රී ලංකාවේ මිනුම් ක්‍රමයටද විද්‍යාත්මක මිනුම් විද්‍යාව, කාර්මික මිනුම් විද්‍යාව සහ නෛතික මිනුම් විද්‍යාව යන මට්ටම් තුනක් ඇත. මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව (MUSSD) යනු ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් විද්‍යා ආයතනය වන අතර, මිනුම් විද්‍යාවේ මෙම මට්ටම් තුනම මෙම ආයතනයට ගොනුකර ඇත. ඒ අනුව, MUSSD මධ්‍යම මිනුම් විද්‍යා අධිකාරියක කාර්යභාරය ඉටු කරන අතර එයට විද්‍යාත්මක මිනුම් විද්‍යාව හා නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ පූර්ණ ඒකාධිකාරය මෙන්ම කාර්මික මිනුම් විද්‍යාව සම්බන්ධීකරණය කිරීමේ බලතල ද ලබා දී ඇත. ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් ප්‍රමිතීන් ස්ථාපිත කිරීම, නඩත්තු කිරීම සහ ඒවා වෙළෙඳ, කාර්මික, සෞඛ්‍ය, පාරිසරික සුරැකුම්... යනාදී ක්ෂේත්‍ර කරා ව්‍යාප්ත කිරීම ක්‍රියාත්මක කරනු ලබන්නේ මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති ජාතික මිනුම් පර්යේෂණාගාරය විසිනි.

1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනත ක්‍රියාත්මක කිරීම සඳහා හෝමාගම, පිටිපන යෝජිත තාක්ෂණ නගරයේ ස්ථාපිත කරනු ලැබ ඇති මෙම දෙපාර්තමේන්තුවේ ජාතික මිනුම් පර්යේෂණාගාර සංකීර්ණය ශ්‍රී ලංකාවේ ඉහළම මිනුම් විද්‍යා අධිකාරිය ලෙස, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව ජාතික මිනුම් ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහ ස්ථාපිත කිරීම සිදුකරන අතර ශ්‍රී ලාංකිකයන්ගේ ජීවන තත්ත්වය සහ ප්‍රමිතිය නංවාලීම සඳහා වන මිනුම් මත පදනම් වූ නියාමන හා සේවා ක්‍රියාකාරකම් තුළින් නිෂ්පාදකයින්, වෙළෙඳුන්, මිනුම් හා ආනුෂංගික වෙනත් සේවා සපයන්නන් සහ පාරිභෝගිකයින් සඳහා යුක්තිය සහ සාධාරණත්වය සහතික කරයි.

ශ්‍රී ලංකා රජය විසින් ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගනිමින් ඉදිරිපත් කර ඇති ජාතික උපායමාර්ගික සැලසුම් විමසා බැලීමෙන් පසුව, දිළිඳුකම පිළිබඳ එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්කයන්ට අනුකූලව ''ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්'' සඳහා වන උපායමාර්ග සඳහා මිනුම් විද්‍යාව විශාල කාර්යභාරයක් ඉටු කරන බව අප විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව, පසුගිය ආර්ථික අර්බුදයේ උච්ඡතම අවස්ථාවන්හිදී පවා ආර්ථිකයේ වෙළෙඳ අංශය පුනර්ජීවනය කිරීම සඳහා අප විසින් විශේෂ අවධානයක් යොමු කළ අතර, ඒ අනුව 2023 වර්ෂය ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළඳාමේ විශ්වසනීයත්වය සහතික කර ඇත. 2024 වර්ෂය තුළදී 2023 වර්ෂයේ ලද අත්දැකීම් හා ජයග්‍රහණ මත පදනම්ව ජාතික ආර්ථිකය නංවාලීම සඳහා ඵලදායී මෙහෙයුම් රැසක් සිදු කිරීමට කාර්යසාධන ඉලක්ක සැලසුම් කර ඇත.

මෙම වසර තුළ ලබාගත් ජයග්‍රහණ පිළිබඳ රාජ්‍ය ආයතනයක් ලෙස අප තෘප්තිමත් වන අතර ඒවා මෙම වාර්ෂික වාර්තාව මගින් පිළිබිඹු කර ඇත.



එස්. එන්. අකුරන්තිලක,
මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා අධ්‍යක්ෂ.

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

පටුන

පිටු අංකය

1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 2

1.3 ප්‍රධාන කාර්යයන් 2

1.4 සංවිධාන සටහන 19

1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු /දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල 21

1.6 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව /පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්..... 22

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 22

2. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ 27

2.1 ජාතික මිනුම් පර්යේෂණාගාරය තුළ මිනුම් අන්වේෂණතාව ස්ථාපනය 28

2.2 අන්තර් විද්‍යාගාර සංසන්දනය සඳහා සහභාගී වීම 28

2.3 සංවර්ධන කටයුතු 29

2.4 ජාතික මිනුම් පර්යේෂණාගාරය මඟින් පැවැත්වූ පුහුණු සහ උපදේශන වැඩසටහන් 31

2.5 ජාත්‍යන්තර සම්බන්ධතාවල ප්‍රගතිය 32

2.6 ජාතික මිනුම් පර්යේෂණාගාරයේ අංක ශෝධන ආදායම් තොරතුරු 38

2.7 ජාතික මිනුම් පර්යේෂණාගාරයේ පෙර ඇසුරුම් , වායු විමෝචන හා වේගමාපක උපකරණ ආදායම 42

2.8 පඩි, මිමි, කිරුම් හා මිනුම් උපකරණ මාදිලි අනුමැතිය 42

2.9 සත්‍යායන ආදායම් 43

2.10 සත්‍යායනය කරන ලද ඒකක සංඛ්‍යාව 45

2.11 වැටලීම් හා නඩු ප්‍රමාණය 46

2.12 දැනුවත් කිරීමේ වැඩසටහන් 49

2.13 දැනුවත් කිරීමේ වැඩසටහන්වල කාර්තුමය ප්‍රගතිය 50

2.14 වාණිජ ක්‍රියාකාරකම්වල නියැළෙන පෞද්ගලික ව්‍යවසායකයන්ගේ ව්‍යාප්තිය 51

2.15 වාණිජ ක්‍රියාකාරකම්වල නියැළෙන පෞද්ගලික ව්‍යවසායකයන් ලියාපදිංචි කිරීම 52

අභියෝග හා ඉදිරි ඉලක්ක 53

3. පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 56

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 59

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 64

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 65

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 70

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 70

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 71

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 71

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 72

4. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක 91

5. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 93

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 95

6. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 98

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය /අතිරික්තය බලපානු ලැබූ ආකාරය 101

6.3 මානව සම්පත් සංවර්ධනය 101

7. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 107

1


ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූලික ප්‍රතිපත්තිය, ක්‍රියාත්මක ව්‍යාපෘතීන් සහ වැඩසටහන් හා 2023 වසර තුළ ලබා ඇති ප්‍රගතිය පිළිබඳව දැනුම් දීම මෙම වාර්තාවේ අරමුණයි.

1.1. හැඳින්වීම

1.1.1. මිනුම් විද්‍යාව


මිනුම් පිළිබඳව හැදෑරීමේ විෂය සහ යෙදීම් මිනුම් විද්‍යාව ලෙස හැඳින්වේ. ස්කන්ධය, දිග, කාලය, පරිමාව, විද්‍යුත් ධාරාව, උෂ්ණත්වය හා පීඩනය ආදී නොයෙක් භෞතික රාශීන්ට අදාළ මිනුම් එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවලදී අපට අවශ්‍ය වේ. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් භෞතික රාශි සහ මිනුම් ඒකකවල ඒකමිතියක් පවත්වාගෙන යාම සඳහා කරනු ලබන විද්‍යාත්මක පර්යේෂණ සහ නියාමන ක්‍රියාකාරකම් මිනුම් විද්‍යාව ලෙස අර්ථ දැක්විය හැකිය.



රූප සටහන 1 : මිනුම් විද්‍යාවේ කාණ්ඩ

ඉහත සඳහන් ලෙස මිනුම් විද්‍යාව ප්‍රධාන වශයෙන් උප ක්ෂේත්‍ර තුනකට බෙදිය හැකිය. සෑම රටකම ජාතික මිනුම් පද්ධතියක් අර්ථ දක්වා ඒවා ජාතික මිනුම් ප්‍රමිතීන් වශයෙන් එරට තුළ ස්ථාපනය කිරීම, පවත්වාගෙන යාම හා විසුරුවා හැරීම පිළිබඳ වගකීම දරන ආයතනයක් ඇත. එය පොදුවේ එක් එක් රටේ ජාතික මිනුම් ආයතනය (National Metrology Institute) ලෙස හඳුන්වනු ලැබේ. ශ්‍රී ලංකාවේ එම වගකීම දරන්නේ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු




1.3 ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකාවේ මිනුම් විද්‍යාව සඳහා වන ඉහළම ආයතනය ලෙස මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව (MUSSD) පහත කාර්යයන්වල වගකීම දරයි.

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව (MUSSD) 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනත යටතේ ස්ථාපිත කරන ලදී. දෙපාර්තමේන්තුව අයත් වන්නේ වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයටයි.

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් මස උද්‍යාන පාර, කොළඹ 05 පිහිටි පැරණි පරිශ්‍රයේ (පර්චස් 135 ක භූමි ප්‍රමාණයකින්) සිට ඉඩම් අවකාශ ප්‍රමාණවත් නොවීම සහ ජාතික අවශ්‍යතා හා මිනුම් විද්‍යා ක්ෂේත්‍රයේ අනාගත සංවර්ධනය උදෙසා පිටිපන, මාහේනවත්ත, හෝමාගම ලිපිනයේ පිහිටි තාක්ෂණ නගරයෙහි විද්‍යා මධ්‍යස්ථානය වෙත මාරු වී ඇත.



රූපසටහන 2 : තාක්ෂණ නගරයේ (Tech City) පිහිටීම (Source : Innovation hub of Asia - Tech City Sri Lanka Western Region Tech City Development Project)

1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරමින් නිරවද්‍ය මිනුම් ක්‍රම හා මිනුම් විද්‍යා සේවාවන් සැපයීම, අදාළ නීති හා රෙගුලාසි පැනවීම තුළින් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම, අන්තර්ජාතික මිනුම් පද්ධතියට අනුකූලව ජාතික මිනුම් ප්‍රමිතීන් පවත්වාගෙනයාම හා යාවත්කාලීන කිරීම ආදිය පිළිබඳව දෙපාර්තමේන්තුව වගකීම දරයි.

1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනතේ II කොටසේ (3) වගන්තියට අනුව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව තුළ ඇති පර්යේෂණාගාරය ජාතික මිනුම් පර්යේෂණාගාරය ලෙස හැඳින්වේ. එකී පනතේ III වන කොටස අනුව ජාතික මිනුම් ප්‍රමිති ස්ථාපිත කිරීම, නඩත්තු කිරීම සහ බෙදාහැරීම, IV වන කොටස අනුව වෙළඳාමේ මිනුම් භාවිතය සහ, V සහ VI කොටස් අනුව කර්මාන්ත ක්ෂේත්‍රයේ මිනුම් භාවිතය පිළිබඳව දෙපාර්තමේන්තුව වගකිව යුතුය. මේ අනුව දෙපාර්තමේන්තුව විද්‍යාත්මක මිනුම් විද්‍යාව, කාර්මික මිනුම් විද්‍යාව සහ නෛතික මිනුම් විද්‍යාව යන අංශ තුනකින් සමන්විත ජාතික මිනුම් පද්ධතිය සඳහා (National Measurement System) වගකිව යුතුය.

දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවා ඇති ජාතික මිනුම් පර්යේෂණාගාරය (National Measurement Laboratory) මඟින් ශ්‍රී ලංකාව තුළ භාවිත මිනුම් හා සම්බන්ධ ජාතික ප්‍රමිතීන් හඳුනාගෙන ඒවා අර්ථ දක්වා ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම හා විසුරුවා හැරීම සිදු වේ. මීට අමතරව කර්මාන්ත, ඉංජිනේරු, පාරිසරික, සෞඛ්‍ය රැකවරණය, මහමග ආරක්ෂාව ආදී ක්ෂේත්‍රවල දී භාවිතා කරන මිනුම් උපකරණ අංක ශෝධනය කිරීම හා සත්‍යාපනය කිරීම ද පර්යේෂණාගාරය මඟින් සිදු කරනු ලැබේ.

නෛතික මිනුම් විද්‍යා කාර්යයන් සඳහා නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධානයේ (OIML) නිර්දේශ භාවිතා කරන අතර එම නිර්දේශවලට අනුකූලව කිරුම් මිනුම් උපකරණවල මාදිලි අනුමත කිරීම, මූලික හා වාර්ෂික සත්‍යාපනය කිරීම සිදුකරනු ලැබේ.



රූප සටහන 3 : මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

ආයතනය පිහිටුවා ඇති නෛතික රාමුව

මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව (MUSSD) 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනත මගින් ස්ථාපිතය.

ආයතනයේ පරමාර්ථ

ජාත්‍යන්තර මිනුම් පද්ධතිය අනුව ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් පද්ධතිය ස්ථාපනය කිරීම හා නියාමනය කිරීම.

1.3.1 විද්‍යාත්මක මිනුම් විද්‍යාව

මිනුම් විද්‍යාවේ වැදගත්ම ක්ෂේත්‍රය මෙය වේ. විද්‍යාත්මක මිනුම් විද්‍යාව යනු මිනුම් ඒකක පද්ධති හා රාශි පද්ධති පිහිටුවීම, මිනුම් විද්‍යාව පිළිබඳ පර්යේෂණ පැවැත්වීම, නව මිනුම් ක්‍රම සොයාගැනීම, ජාත්‍යන්තර හා ජාතික මිනුම් ප්‍රමිතීන් හඳුනා ගැනීම, අර්ථ දැක්වීම, පිහිටුවීම හා එම ප්‍රමිතීන්වල ඒකමිතිය පවත්වා ගනිමින් ඒවා භාවිතා කරන්නන් වෙත ව්‍යාප්ත කිරීම පිළිබඳ විෂය ක්ෂේත්‍රයයි. එමෙන්ම මිනුම් දෝෂ හඳුනා ගැනීම හා නිරවුල් කිරීම ආදිය සඳහා බලපාන සිද්ධාන්තික හා ප්‍රායෝගික කරුණු ද විද්‍යාත්මක මිනුම් විද්‍යා ක්ෂේත්‍රය මගින් ආවරණය වේ.

විද්‍යාත්මක මිනුම් විද්‍යාවට අදාළ ඉහත කාර්යයන් ඉටුකිරීම සඳහා ගෙන ඇති පියවර කිහිපයකි.

01. ජාතික මිනුම් පර්යේෂණාගාරය පිහිටුවීම මගින් ජාතික මිනුම් ප්‍රමිති පද්ධතිය හා මිනුම් ඒකක ක්‍රමය ස්ථාපනය කිරීම.

02. ජාතික මිනුම් ප්‍රමිතීන් නිරූපණය, ස්ථාපනය, පවත්වාගෙනයාම හා ව්‍යාප්ත කිරීම.

03. ජාත්‍යන්තර මිනුම් ප්‍රමිතීන්හි මිනුම් අන්වේෂණයට අනුකූල වන පරිදි ජාතික මිනුම් ප්‍රමිතීන් ස්ථාපනය කිරීම හා පවත්වාගෙන යාම.

04. විවිධ ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය වන මිනුම් පරාමිතීන් හා තාක්ෂණය ව්‍යාප්ත කිරීම හා ප්‍රවර්ධන කටයුතු.

05. මිනුම් රාශීන්ට අදාළ දේශීය හා ජාත්‍යන්තර මට්ටමේ ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික සන්සන්දන වැඩසටහන්වලට සහභාගී වී අංක ශෝධන හා මිනුම් ශක්‍යතා ඉහළ නැංවීම.

06. මිනුම් විද්‍යා පර්යේෂණ කටයුතු.

07. ශ්‍රී ලංකාවේ සම්මත වේලාව පවත්වාගෙන යාම හා www.sltime.org වෙබ් අඩවිය ඔස්සේ විකාශනය කිරීම.

1.3.1.1 ජාතික මිනුම් පර්යේෂණාගාරය

ජාතික මිනුම් ඒකක ක්‍රමය ස්ථාපනය, අංකශෝධන හා පරීක්ෂණ විද්‍යාගාර, නියාමන ආයතන, කර්මාන්ත හා නෛතික මිනුම් විද්‍යා ක්ෂේත්‍ර සඳහා අන්වේෂණය (Traceability) ලබා දීම හා ව්‍යාප්ත කිරීම සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව හෝමාගම, පිටිපන, මාහේනවත්තෙහි පිහිටි එහි නව පරිශ්‍රයෙහි විද්‍යාගාර කාමර 66ක් සහිතව ජාතික මිනුම් පර්යේෂණාගාරය පිහිටුවා ඇත. වර්තමානයේ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මිනුම් ක්ෂේත්‍ර 13 ක් සඳහා විද්‍යාගාර කාමර 29ක් ක්‍රියාකාරිව පවත්වාගෙන යනු ලැබේ.

ජාතික මිනුම් පර්යේෂණාගාරය

විද්‍යාගාරය	*විද්‍යාගාර ප්‍රධානී*	*දුරකතන අංක*
ස්කන්ධය	ආර්. ඩී. එම්. අලංක මහතා	0112-182262
මානමිතිය	ඒ. ඩී. ඩී. නමින්ද මහතා	0112-182267
කාලය හා සංඛ්‍යාතය	ආර්. ජී. එස්. ඒ. පෙරේරා මහතා	0112-182265
සරලධාරා විද්‍යුතය	ආර්.ජී.එස්.ඒ.පෙරේරා මහතා	0112-182265
උෂ්ණත්වය	එස්.එන්.අකුරන්තිලක මහතා	0112-182253
පීඩනය	ජේ.එස්.එම්.සිල්වා මිය.	0112-182264
පරිමාමිතික	එච්.එල්.අයි.එස්. සම්පත් මහතා	0112-182266
විද්‍යුත් ජවය හා ශක්තිය	ආර්.ඩී.එම්.අලංක මහතා	0112-182262
රසායනික මිනුම්	එස්.ඩී.අයි.ඩයස් මහතා	0112-182258
වායුන් පිළිබඳ මිනුම්	ආර්.ජී.එස්. ඒ.පෙරේරා මහතා	0112-182265
තෙතමනය හා ආර්ද්‍රතාවය	කේ.එස්.මල්ලවආරච්චි මිය.	0112-182263
කිරුම් උපකරණ මාදිලි අනුමැති විද්‍යාගාරය	ආර්.ජී.එස්.ඒ.පෙරේරා මහතා	0112-182265
බලය පිළිබඳ විද්‍යාගාරය	ආර්.ජී.එස්.ඒ.පෙරේරා මහතා	0112-182265

වගුව අංක 1

ජාතික මිනුම් පර්යේෂණාගාරය ප්‍රමිතීන්

මිනුම	ප්‍රාථමික/ද්විතියික ප්‍රමිතීන්
ස්කන්ධය	කිලෝග්‍රෑම් 1 හි ජාතික මූලාදර්ශය 1 mg සිට 20 kg දක්වා E 1 ශ්‍රේණියේ පඩි කට්ටලය
දිග	He/Ne ලේසර් ආලෝකය ■ K ශ්‍රේණියේ ආමාන කුට්ටි ■ K වානේ 0.5 mm සිට 100 mm දක්වා ■ K වානේ 400 mm, 500 mm ■ K ටංග්ස්ටන් කාබයිඩ් 0.5 mm සිට 100 mm දක්වා ■ K ටංග්ස්ටන් කාබයිඩ් 1 mm සිට 100 mm දක්වා විශේෂ කට්ටලය ■ 00 සෙරමික් 0.5 mm සිට 100 mm දක්වා ■ 00 ටංග්ස්ටන් කාබයිඩ් 0.5 mm සිට 100 mm දක්වා ■ 0.1 mm සූක්ෂම රේඛා පරිමාණ
කාලය හා සංඛ්‍යාතය	සීසියම් (Cs) ප්‍රාථමික සංඛ්‍යාත ප්‍රභවය, රූබීඩියම් (Rb) ප්‍රාථමික සංඛ්‍යාත ප්‍රභවය
උෂ්ණත්වය	රසදිය (Hg) ත්‍රික ලක්ෂ්‍යයේ සිට ඇලුමිනියම් (Al) ඝනීකරණ ලක්ෂ්‍යය (-38.834 ^{0}C සිට 660.323 ^{0}C දක්වා) අචල ලක්ෂ්‍ය 7ක්
සරල ධාරා විද්‍යුතය	පරිවර්තන ප්‍රමිතීන් (1000 V සහ 20 A දක්වා) සෙනර් වෝල්ටීයතා ප්‍රමිතීන් 1 V, 10 V ප්‍රතිරෝධ පිළිබඳ ප්‍රමිතීන් 1 GΩ දක්වා
පීඩනය	200 MPa දක්වා ද්‍රව පීඩන තුලාව 7 MPa දක්වා වායු පීඩන තුලාව 175 kPa දක්වා වායු පීඩන තුලාව
පරිමාව	මයික්‍රොපිපෙට්ටු අංක ශෝධනය - ස්කන්ධමිතික ක්‍රමය (1µL to 1mL) පරිමාමිතික උපකරණ ක්‍රමාංකනය - ස්කන්ධමිතික ක්‍රමය (1 mL - 500 L) පරිමාමිතික උපකරණ ක්‍රමාංකනය - පරිමාමිතික ක්‍රමය (2 L - 5000 L)
විද්‍යුත් ජවය හා ශක්තිය	විද්‍යුත් ජවය හා ශක්තිය පිළිබඳ සන්සන්දකය (10 mA to 120 A දක්වා, 300V) MTE K2006 Three phase comparator (0.01%)
රසායනික මිනුම්	ද්විතීය ප්‍රමිති සන්නායක හා ද්‍රාවණ (Secondary Conductivity Solutions) - pH-0-14 රුධිරයේ මධ්‍යසාර ප්‍රමිති ද්‍රාවණ (Reference Solutions - Alcohol in blood) - 50 mg/100 mL, 80 mg/100 mL, 150 mg/100 mL ද්විතීය ප්‍රමිති සන්නායක හා ද්‍රාවණ (Secondary Conductivity Solutions) - 84 mg/cm, 1413 mg/cm, 12.9 mg/cm, 111.8 mg/cm
ආර්ද්‍රතාමිතික	ආර්ද්‍රතාමිතික කුටීර (-40 ^{0}C සිට 180 ^{0}C දක්වා) ආර්ද්‍රතාවය මැනීමේ උපකරණ (10% - 90 % RH)

වගුව අංක 2

1.3.1.2. මිනුම් අන්වේෂණතාව (Measurement Traceability) ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකාව තුළ මිනුම් සඳහා මිනුම් අන්වේෂණතාව (Measurement Traceability) ස්ථාපිත කිරීම ජාතික මිනුම් පර්යේෂණාගාරයේ වගකීමකි. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත අනුව ජාතික මිනුම් පර්යේෂණාගාරයේ පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා ප්‍රමිති වෙනත් රටක ජාතික පර්යේෂණාගාරයක අංක ශෝධනය කරනු ලබයි. එම විදේශීය ජාතික මිනුම් පර්යේෂණාගාරය ජාත්‍යන්තර පඩි හා මිමි කාර්යාංශයේ වෙබ් අඩවියේ මූලික සන්සන්දන පිළිබඳ දත්ත සමුච්චිතයේ (Key Comparison Data Base) හි අංක ශෝධන හා මිනුම් පිළිබඳ ශක්‍යතා අගයන් (Calibration and Measurement Capabilities) ප්‍රතිෂ්ඨාපනය කිරීම මගින් අන්තර්ජාතික පිළිගැනීමට ලක්ව ඇති පර්යේෂණාගාරයක් වීම අවශ්‍යම කරුණකි.

1.3.1.3 අන්තර් සංසන්දනය සඳහා සහභාගී වීම (Inter Laboratory Comparisons)

අංක ශෝධන හා පරීක්ෂණ කටයුතු සිදුකරනු ලබන විද්‍යාගාරවල මිනුම් අතර සමානත්වයක් පවත්වාගෙන යනු පිණිස අන්තර් සංසන්දනය පැවැත්වේ.

ශ්‍රී ලංකාව තුළ සිදුකරනු ලබන මිනුම් අනෙකුත් රටවල්වල සිදුකරනු ලබන මිනුම්වල අගයන්ට සමාන බව පෙන්වාදීම සඳහා අන්තර්ජාතික මට්ටමින් පවත්වනු ලබන අන්තර් සංසන්දනය සඳහා ජාතික මිනුම් පර්යේෂණාගාරය සහභාගී වේ. මෙලෙස මෙරට තුළ මිනුම් ලබාගැනීමේ නිපුණතාව ඔප්පු කිරීම ජාත්‍යන්තර වෙළඳාමේදී බලපැවැත්වෙන වෙළඳ බාධක අවම කරගැනීම සඳහා වැදගත් වේ. තවද මෙරට තුළ පවතින අංක ශෝධන විද්‍යාගාර විසින් නිකුත් කරනු ලබන අංක ශෝධන සහතිකවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීම සඳහා පවත්වනු ලබන දේශීය අන්තර් සංසන්දනය සඳහා ද ජාතික මිනුම් පර්යේෂණාගාරය දායකත්වය සපයයි.

1.3.1.4 ජාත්‍යන්තර ක්‍රමයේ ඒකක (SI) පවත්වා ගැනීම



2018 නොවැම්බර් 16 වන දින පැවති පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනයේ (CGPM) 26 වන සැසිවාරයේදී දැනට භාවිත වන SI මූල ඒකකවල අර්ථ දැක්වීම් සංශෝධනය කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව කිලෝග්‍රෑමය, ඇම්පියර්, කෙල්විනය සහ මවුලය යන මූල ඒකකවල අර්ථ දැක්වීම වෙනස් කරමින් SI ඒකක සංශෝධනය කිරීම සඳහා එකඟත්වයට පැමිණෙන ලදී .

මෙම තීරණය අනුව 2019 මැයි 20 ලෝක මිනුම් විද්‍යා දිනයේ සිට සියලුම SI ඒකක සඳහා ස්වාභාවික ලෝකය විස්තර කරන නියතයන් අනුව අර්ථ දක්වන ලද නව SI මූල ඒකක භාවිතා කිරීම ආරම්භ කර ඇත. මෙමගින් SI ඒකක පද්ධතියේ අනාගත ස්ථායිතාව සහතික කෙරෙන අතර ක්වොන්ටම් තාක්ෂණය ඇතුළු නව තාක්ෂණයන් භාවිතා කිරීමට අවස්ථාවන්ද විවෘත වේ. SI ඒකක අර්ථ දැක්වීම සඳහා භාවිතා වන නියතයන් හත පහත වගු අංක 3 හි දක්වා ඇත.

SI මූල ඒකක හතේ නව අර්ථ දැක්වීම්වලට යොදා ගන්නා මූලික භෞතික නියතයන්

නියතය	සලකුණ	සංඛ්‍යාත්මක අගය	ඒකක
Cs - 133 පරමාණුවේ භූමි අවස්ථාවේ අධි සූක්ෂම මට්ටම් අතර සංක්‍රමණයට අනුරූප විකිරණයෙහි කාලාවර්ත සංඛ්‍යාව	ΔVcs	9 192 631 770	Hz
රික්තයේදී ආලෝකයේ ප්‍රවේගය	c	299 792 458	$m\ s^{-1}$
ප්ලාන්ක් නියතය	h	$6.626\ 070\ 15 \times 10^{-34}$	J s
මූලික ආරෝපණය	e	$1.602\ 176\ 634 \times 10^{-19}$	C
බෝල්ට්ස්මාන් නියතය	k	$1.380\ 649 \times 10^{-23}$	$J\ K^{-1}$
ඇවගාඩ්රෝ නියතය	N_A	$6.022\ 140\ 76 \times 10^{23}$	mol^{-1}
ප්‍රදීපන සඵලත්වය	K_{cd}	683	$lm\ W^{-1}$

වගුව අංක 3

1.3.1.5 ශ්‍රී ලංකාවේ සම්මත වේලාවේ නිපදවීම සහ විකාශය

ශ්‍රී ලංකාවට සම්මත වේලාව සැපයීමේ පුරෝගාමියා වීමේ ගෞරවය 2011 වසරේ සිට හිමිවන්නේ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවටයි. දිවයින පුරා කාලය පිළිබඳ ඒකමිතියක් ඇති කරනු පිණිස ජාතික මිනුම් පර්යේෂණාගාරයේ විද්‍යුත් කාලය හා සංඛ්‍යාතය පිළිබඳ විද්‍යාගාරයේ විශේෂ ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාවේ සම්මත වේලාව නිපදවීමේ කටයුතු ආරම්භ කරන ලදි. ඒ සඳහා රුබීඩියම් පරමාණුක ඔරලෝසුවක් ස්ථාපිත කර එමගින් ජාත්‍යන්තර කාල කාණ්ඩාංක වලට අනුකූල වන පරිදි ශ්‍රී ලංකාවේ නිවැරදි වේලාව සකස් කර විකාශනය කිරීම සිදුවේ. නිවැරදි වේලාව විකාශනය සඳහා 2011 අප්‍රේල් මස www.sltime.org වෙබ් අඩවිය විවෘත කරන ලදි. දවසේ ඕනෑම වේලාවක මෙම වෙබ් අඩවියට පිවිස ශ්‍රී ලංකාවේ නිවැරදි වේලාව දැන ගැනීමේ පහසුව දැන් ශ්‍රී ලාංකිකයන්ට ලැබී ඇත. මෙම වෙබ් අඩවිය ඇසුරෙන් තමන් භාවිතා කරන ඔරලෝසුවල වේලාව නිවැරදිව සකස් කර ගන්නා ලෙස අදාළ සියලු පාර්ශ්වයකටම උපදෙස් දෙනු ලැබේ.

වර්තමානයේ කාලය මැනීමේ පද්ධතිය සීසියම් ප්‍රාථමික සංඛ්‍යාත ප්‍රමිතියෙන් සමන්විත වේ. කාල පද්ධතිය අංක ශෝධනය කර ඇති අතර දැන් BIPM හි UTC (ජාත්‍යන්තර සම්මත වේලාව) තීරණය කිරීමට දායක වේ. අන්වේෂණය (Traceability) ලබා ගැනීම සමග කාල සම්බන්ධතාවය ස්ථාපිත කර ඇත. NTP (ජාල කාල ප්‍රොටොකෝලය) සේවාදායකයන්ට නිවැරදි වේලාව බෙදා හැරීම සඳහා ස්ථාපිත කර ඇත.

1.3.2 කාර්මික මිනුම් විද්‍යාවේ ක්‍රියාකාරකම්

කාර්මික මිනුම් විද්‍යාව යටතේ මිනුම් විද්‍යාව කර්මාන්ත හා නිෂ්පාදන කටයුතුවලදී යොදා ගන්නා ආකාරය පිළිබඳව සලකනු ලැබේ. මිනුම් උපකරණ භාවිතයේ යෝග්‍යතාව සහතික කරමින් ඒවා

කර්මාන්ත ආදී ක්ෂේත්‍රවලදී යොදාගැනීමත්, මිනුම්වල තත්ත්ව පාලන කටයුතු කිරීමත්, කාර්මික මිනුම් විද්‍යාවට අදාළ වේ. එහිදී ගුණාත්මක නිෂ්පාදන ක්‍රියාවලියක අවශ්‍යතාවලට අනුකූලවන පරිදි කාර්මික අංක ශෝධන කටයුතු හා මිනුම් උපකරණ කළමනාකරණ කටයුතු සිදු කරනු ලැබේ.

කාර්මික මිනුම් විද්‍යාවට අදාළ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන සේවා පහත පරිදි වේ.

1. කර්මාන්තවල නිෂ්පාදන ක්‍රියාවලියේ භාවිත කරන පඩි, මිමි සහ කිරුම් හා මිනුම් උපකරණ අංක ශෝධනය කිරීම. (පරීක්ෂණාගාරය තුළ සහ බාහිර අංක ශෝධනය ද ඇතුළත්ව)

2. නිෂ්පාදන හා සේවා කර්මාන්තවල පිහිටුවා ඇති විශාල පරිමාණයේ මිනුම් උපකරණ පද්ධති පරීක්ෂා කිරීම.

3. කර්මාන්ත ආශ්‍රිත මිනුම්වලට අදාළ මිනුම් ගැටලු විසඳීම පිළිබඳ පුහුණුව හා උපදෙස් සැපයීම.

1.3.2.1 කාර්මික අංක ශෝධනය

කාර්මික, ඉංජිනේරු හෝ වෙනත් ආශ්‍රිත ක්ෂේත්‍රවල භාවිත වන පීඩනමාන, උෂ්ණත්වමාන, පඩි, තරාදි, දිග මැනීමේ උපකරණ, විදුලි මිනුම් උපකරණ, තෙතමනය මැනීමේ උපකරණ, පරීක්ෂණාගාර කිරුම් තරාදි ආදිය සඳහා අංක ශෝධන පහසුකම් ජාතික මිනුම් පර්යේෂණාගාරය (NML) වෙතින් ලබා ගත හැකිය. එවැනි අංක ශෝධන සඳහා සහතිකද නිකුත් කරනු ලැබේ.




කාර්මික අංක ශෝධනය යනු ජාතික මිනුම් පර්යේෂණාගාරය (NML) විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන්ගෙන් එකකි. NML විසින් සපයනු ලබන අංක ශෝධන විස්තර පහත දක්වා ඇත. අංක ශෝධනය සඳහා වන ගාස්තු සංශෝධනය කිරීම 2015 ජූලි 2 දිනැති 1921/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයට අනුව සිදුවන අතර එම ගාස්තු නැවත සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී.

ජාතික මිනුම් පර්යේෂණාගාරය විසින් 2023 වර්ෂය අවසන් වන විට යාවත්කාලීන කරන ලද සේවා

	විද්‍යාගාරයේ නම	*සපයනු ලබන අංක ශෝධන සේවා*
1	උෂ්ණත්වමිතික විද්‍යාගාරය 	1. සායනික උෂ්ණත්වමාන 2. කාර්මික සහ විද්‍යාගාර උෂ්ණත්වමාන සංඛ්‍යාංක උෂ්ණත්වමාන 3. Dial thermometer probe 4. තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන සහ ප්‍රතිරෝධ උෂ්ණත්වමාන 5. වීදුරු ද්‍රව උෂ්ණත්වමාන 6. Maximum Registered උෂ්ණත්වමාන 7. උපරිම අවම උෂ්ණත්වමාන 8. බිත්ති උෂ්ණත්වමාන 9. පෘෂ්ඨවල උෂ්ණත්වය මැනීමේ උපකරණ 10. අධෝරක්ත උෂ්ණත්වමාන 11. සම්මත ප්ලැටිනම් ප්‍රතිරෝධ උෂ්ණත්වමාන (සන්සන්දන ක්‍රමය) 12. ප්ලැටිනම් ප්‍රතිරෝධ උෂ්ණත්වමාන (අචල ලක්ෂ්‍ය ක්‍රමය) 13. කාර්මික තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන (සන්සන්දන ක්‍රමය) 14. කාර්මික තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන (අචල ලක්ෂ්‍ය ක්‍රමය) 15. උෂ්ණත්වමිතික තාපක (ද්‍රව සහ වියළි) 16. උෂ්ණත්ව මිතික රේඛයන් (Chart Recorder) 17. විද්‍යාගාර උඳුන් (Oven) 18. ඔටොක්ලේව් 19. ඉන්කියුබේටර සහ ජල තාපක 20. අධිශීතකරණ සහ ශීතකරණ (තනි කුටීර, කුටීර දෙක හෝ වැඩි) 21. ශීත කාමරය (කාමර උෂ්ණත්ව මිනුම්) 22. ශීත කාමරය (තාප ස්විච දර්ශක සහිත පද්ධති) 23. තාප ස්වීච/පාලක 24. ඩේටා ලොගර් (Data Loggers)

2	විද්‍යුත් ජවය සහ ශක්තිය පිළිබඳ විද්‍යාගාරය 	1. කිලෝ වොට් පැය මීටර (එකලා) 2. කිලෝවොට් පැය මීටර (තෙකලා) 3. කිලෝවොට් ඇම්පියර් පැය මීටර (තෙකලා) 4. ජංගම විද්‍යුත් බලය/ශක්තිය මැනීමේ උපකරණ (එකලා) 5. ජංගම විද්‍යුත් බලය/ ශක්තිය මැනීමේ උපකරණ (තෙකලා) 6. විදුලි මනු පරීක්ෂා කිරීමේ පද්ධතිවල මීටර (එකලා) 7. විදුලි මනු පරීක්ෂා කිරීමේ පද්ධතිවල මීටර (තෙකලා) 8. විද්‍යුත් ශක්ති මීටර (විද්‍යාගාර/ස්ථාවර/එකලා) 9. විද්‍යුත් ශක්ති මීටර (විද්‍යාගාර/ස්ථාවර/තෙකලා) 10. විද්‍යුත් බලය මැනීමේ උපකරණ (විද්‍යාගාර/ස්ථාවර/එකලා/ජංගම) 11. විද්‍යුත් බලය මැනීමේ උපකරණ (විද්‍යාගාර/ස්ථාවර/තෙකලා/ජංගම) 12. ප්‍රසංවාද (Harmonic) ආශ්‍රිත මිනුම්
3	පරිමාමිතික විද්‍යාගාරය 	1. බෙදුම් රහිත මිනුම් 2. පරිමාමිතික මිනුම් 3. මිනුම් සිලින්ඩර 4. විශාල පරිමා සහිත ටැංකි 5. මයික්‍රෝ පිපෙට්ටු, පිපෙට්ටු, බියුරෙට්ටු

4	පීඩන මිනුම් විද්‍යාගාරය 	**ISO 17025:2017** අනුව ප්‍රතීතනය (Accreditation) කරන ලද හා අන්තර්ජාතික පිළිගැනීම (International Recognition) ලබා ගන්නා ලදි. මෙම විද්‍යාගාරය මගින් පහත අංක ශෝධන සේවාවන් සපයනු ලැබේ. 1. වායු පීඩනමාන 2. ද්‍රව පීඩනමාන 3. රසදිය රුධිර පීඩනමාන 4. සංඛ්‍යාංක රුධිර පීඩන මාන 5. පරිසර පීඩන තත්ත්වය මැනීමේ උපකරණ (Barometric Pressure Measuring) 6. රික්තක පීඩනමාන (-100kPa) 7. නිරපේක්ෂ පීඩනමාන
5	ස්කන්ධමිතික විද්‍යාගාරය 	1. කිරුම් පඩි (OIML E2, F1, F2, M) 2. කාර්මික කිරුම් පඩි (සුදු යකඩ / වෙනත්) 3. තරාදි - ඉලෙක්ට්‍රොනික / යාන්ත්‍රික (OIML නිරවද්‍යතා පන්තිය I, II, III, IV) 4. කඩදාසි තුලා 5. දොඹකර තුලා 6. එල්ලන තරාදි 7. පාලම් තරාදි 8. බොත්තම් අදින යන්ත්‍ර 9. හෝපර් තුලා

6	මානමිතික විද්‍යාගාරය 	1. ආමාන කුට්ටි 2. මිනුම් කෝදු 3. මිනුම් පටි 4. කැලිපර් 5. මයික්‍රොමීටර 6. උස ආමාන 7. දර්ශක ආමාන 8. සණකම ආමාන 9. බෝර් ආමාන 10. ෆීලර් ආමාන 11. සමතල බව මැනීම 12. අන්වීක්ෂ 13. සමාන්තර බව මැනීම 14. රේඛා පරිමාණ
7	සරල ධාරා විද්‍යුතය පිළිබඳ විද්‍යාගාරය 	1. වෝල්ට් මීටර (සරල ධාරා/ ප්‍රත්‍යාවර්ත ධාරා) 2. ඇමීටර (සරල ධාරා/ ප්‍රත්‍යාවර්ත ධාරා) 3. ඕම් මීටර 4. බහු මීටර 5. ප්‍රතිරෝධමීටර 6. වෝල්ටීයතා මූලාශ්‍ර (Voltage Sources) 7. ධාරා මූලාශ්‍ර (Current Sources) 8. ප්‍රතිරෝධ මූලාශ්‍ර (Resistance Sources)
8	කාලය සහ සංඛ්‍යාත මිනුම් විද්‍යාගාරය 	1. කාලය/විරාම ඝටිකා 2. සංඛ්‍යාතය/ටැකෝ මීටර 3. දෝලනේක්ෂ 4. තරංග ජනක

9	රසායනික මිනුම් විද්‍යාගාරය 	1. ඇල්කොහොල් විශ්ලේෂක (Alcolyzers) 2. පී. එච්. මීටර (pH meter) 3. සන්නායකතා මීටර (Conductivity meters) 4. පරීක්ෂණාගාර සඳහා ප්‍රවීණතා පරීක්ෂණ (Proficiency Testing) පැවැත්වීම
10	තෙතමනය හා ආර්ද්‍රතාවය පිළිබඳ මිනුම් විද්‍යාගාරය 	1. සංඛ්‍යාංක ආර්ද්‍රතාමාන 2. තෙත් හා වියළි බල්බ ආර්ද්‍රතාමාන

11	වායු ප්‍රමිතීන් පිළිබඳ විද්‍යාගාරය  	**O_2, CO_2 , CO, HC** මනින මිනුම් උපකරණ
12	මාදිලි අනුමැති විද්‍යාගාරය  විද්‍යාගාරය 01  විද්‍යාගාරය 02	මාදිලි අනුමැතිය ලබා දීම - නව උපකරණ හා ලබාදී ඇති මාදිලි අනුමැති අලුත් කිරීම. (වෙළෙඳාම, පාරිභෝගික ආරක්ෂණය, මහජන ආරක්ෂාව, පරිසර ආරක්ෂණයට අදාළ උපකරණ) 1. වෙළෙඳාමේදී භාවිත වන කිරුම් උපකරණ 2. පාලම් තරාදි 3. විශේෂිත ක්ෂේත්‍ර සඳහා භාවිත කරන කිරුම් උපකරණ (කර්මාන්ත අවශ්‍යතා සඳහා) 4. වේගමාපක උපකරණ 5. ඉන්ධන පොම්ප 6. පරිමාමිතික උපකරණ 7. වාහන දුම් පරීක්ෂණ උපකරණ 8. ඇල්කොහොල් විශ්ලේෂක

1.3.3 නෛතික මිනුම් විද්‍යාවේ ක්‍රියාකාරකම්

නෛතික පාලනය යටතට ගැනෙන ක්ෂේත්‍රය නෛතික මිනුම් විද්‍යාව ලෙස හැඳින්වේ. එනම් මිනුම් හා මිනුම් උපකරණ භාවිතයේදී සපුරාලිය යුතු නෛතික අවශ්‍යතා පරීක්ෂා කර රටේ පවතින මිනුම් නීතිවලට අනුකූල බවට සහතික කිරීමේ ක්‍රියාවලියයි. ඒ සඳහා 1995 අංක 35 දරන පනත මගින් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සපයා ඇත. ඒ අනුව සෞඛ්‍යය, කර්මාන්ත, මහජන ආරක්ෂාව, පරිසර ආරක්ෂණය, බදුකරණය, පාරිභෝගික රැකවරණය සහ සාධාරණ වෙළෙඳාම යන අංශ සැලකිල්ලට ගෙන පනවනු ලබන නීති හා රෙගුලාසි නියාමනය කිරීම සිදුවේ.

නෛතික මිනුම් විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන කාර්යයන් පනත සහ එහි ඇතුළත් නියෝග මගින් අර්ථකථනය කොට ඇත. සෑම වාණිජ කටයුත්තකදීම සිදු කරන කිරුම්, මිනුම් ආදිය මිනුම් නීතියට යටත් වේ. ඒ අනුව පහත සඳහන් නියාමන කාර්යයන් සිදුකිරීම සඳහා පනත මගින් දෙපාර්තමේන්තුවට බලය පවරා තිබේ.

01. තෘතියික ප්‍රමිති අංක ශෝධන කටයුතු සැලසුම් කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් තෘතියික ප්‍රමිති පවත්වාගෙන යාම

    (මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතට අනුව සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙකුම මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධිකාරි තනතුර හොබවන අතර තෘතියික ප්‍රමිතීන් ඔහු භාරයේ ඇත.)

02. වෙළෙඳාමේ දී භාවිත කෙරෙන සියලුම පඩි, මිමි, කිරුම් හා මිනුම් උපකරණ වල මූලික හා වාර්ෂික සත්‍යාපන කටයුතු

03. වෙළෙඳාමේදී භාවිත කෙරෙන සියලුම පඩි, මිමි, කිරුම් හා මිනුම් උපකරණ නිෂ්පාදනය කරන්නන්, ආනයනය කරන්නන්, අලුත්වැඩියා කරන්නන් හා අලෙවිකරන්නන් වාර්ෂිකව ලියාපදිංචි කිරීම

04. පනතේ දක්වා ඇති දණ්ඩන විධිවිධාන ක්‍රියාත්මක කිරීම මගින් පාරිභෝගික ආරක්ෂාව සැලසීම

05. නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ වෙළෙන්දන් හා පාරිභෝගිකයන් දැනුවත් කිරීම

06. වෙළෙඳාමේදී සහ කර්මාන්ත අංශයන්හි භාවිත කරන කිරුම් හා මිනුම් උපකරණවල මාදිලි අනුමතකිරීම (ජාතික මිනුම් පර්යේෂණාගාරය මෙම සේවාව ලබාදෙයි)

07. පෙර ඇසුරුම් (Prepackages) පරීක්ෂා කිරීම හා පාලනය කිරීම

08. මාර්ග ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ මිනුම් උපකරණ සත්‍යාපනය කිරීම

09. වෙළෙඳ පොළ වැටලීම් සිදුකර කිරුම්, මිනුම් වංචාකරන පුද්ගලයන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම

1.3.3.1 තෘතියික ප්‍රමිති නැවත සත්‍යාපනය කිරීම

වෙළෙඳ කටයුතුවලදී භාවිත කරන පඩි, මිමි හා කිරුම් මිනුම් උපකරණ සත්‍යාපනය කිරීම සඳහා යොදාගන්නා තෘතියික ප්‍රමිතීන් සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම දිස්ත්‍රික් ලේකම්වරයා යටතේ පවත්වාගෙන යයි. එම ප්‍රමිතීන්හි අංකශෝධන කාර්යය ජාතික මිනුම් පර්යේෂණාගාරයේදී සිදු කරනු ලැබේ. සම්මත පඩි, පරිමා මිනුම් සහ දිග පිළිබඳ මිනුම් මෙම තෘතියික ප්‍රමීතීන් වශයෙන් සලකනු ලැබේ.

1.3.3.2 මාදිලි අනුමැතිය

මාදිලි අනුමැතිය යනු, කිසියම් පඩියක්, මිම්මක්, කිරුම් හෝ මිනුම් හෝ උපකරණයක් නිෂ්පාදකයකු විසින් වෙළෙඳපොළට එවීමට හෝ ආනයනකරුවකු විසින් ගෙන්වා විකිණීමට හෝ පෙර එය ක්‍රියාත්මක වන මිනුම් පිළිබඳ නීතිරීතිවලට අනුකූල වන්නේද යන්න සුදුසුකම්ලත් පරීක්ෂණාගාරයකින් පරීක්ෂා කරවාගෙන, අනුමත කර ගැනීමයි. මාදිලි අනුමත කිරීම තාක්ෂණික පරීක්ෂාවක් වේ. ඒ අනුව මිනුම් උපකරණයේ මූලාකෘතිය ජාතික මිනුම් පර්යේෂණාගාරයේදී සම්පූර්ණ පරීක්ෂාවට ලක් කෙරේ. එහිදී මිනුම් උපකරණයේ එක් එක් කොටස් නිර්මාණය කර ඇති ආකාරය, අන්තර්ජාතික නෛතික මිනුම් විද්‍යා සංවිධානයේ (InternationalOrganization of Legal Metrology"OIML) නිර්ණායකවලට අනුකූලද යන්න සොයා බැලේ. පරීක්ෂණ ප්‍රතිඵල ඇගයීම මත පදනම්ව වෙළෙඳාමේදී භාවිත වන කිරුම් උපකරණ, පාලම් තරාදි, විශේෂිත ක්ෂේත්‍ර සඳහා භාවිතා වන කිරුම් උපකරණ, වේග මාපක උපකරණ, පරිමාමිතික උපකරණ, වාහන විමෝචන පරීක්ෂණ ඒකක සහ ඉන්ධන පිරවුම් යන්ත්‍ර ඇතුළු මිනුම් උපකරණ සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව (MUSSD) විසින් මූලාකෘතියට අදාළ මාදිලිය සඳහා අනුමැතිය ලබා දෙනු ලැබේ. වෙළෙඳ කටයුතුවලට හෝ වෙනත් නෛතික කාර්යයන් සඳහා හෝ භාවිත කරන කිරුම් හෝ මිනුම් හෝ උපකරණ නිෂ්පාදකයන් සහ ආනයනකරුවන් එම උපකරණ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගත යුතුය.

1.3.3.3 දිස්ත්‍රික් මට්ටමින් මෙහෙය වන කිරුම් හා මිනුම් උපකරණ වාර්ෂිකව සත්‍යායනය කිරීම්, පරීක්ෂණ හා වැටලීම්

වෙළෙඳාමේදී භාවිත වන කිරුම් හා මිනුම් උපකරණ සත්‍යායන කටයුතු සිදු කරනු ලබන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පිහිටුවා ඇති මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශවල සේවයේ නියුතු මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂකවරුන් (Inspectors of Measurement Services and Devices) විසිනි. දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය සහිතව පිහිටුවනු ලැබූ මුද්‍රා මධ්‍යස්ථානවලදී මෙන් ම සේවා නියෝජිතයින් විසින් ඉල්ලීම් කරන ආකාරය අනුව ක්ෂේත්‍ර/ජංගම මුද්‍රා පහසුකම් සැලසීමද මෙහිදී සිදුකරනු ලැබේ. තවද සෑම දිස්ත්‍රික්කයකම පිහිටා ඇති පාලම් තරාදි ද වසරක් පාසා මුද්‍රා කිරීම සඳහා පාලම් තරාදි පරීක්ෂා කිරීමේ ජංගම ඒකකයක් (Weighbridge Verification Unit) පිහිටුවා තිබේ. රට පුරා ඉන්ධන පිරවුම්හල්වල පිහිටි ඉන්ධන නිකුත් කිරීමේ යන්ත්‍ර ද වසරකට වරක් සත්‍යායනය කිරීම සඳහා ජංගම ඒකකයක් (Fuel Dispensers Verification Unit) පිහිටුවා ඇත. තවද දුම්මාන පරීක්ෂාව සිදු කරනු ලබන උපකරණ සත්‍යායන සේවා පවත්වාගෙන යනු ලබයි.

රට තුළ භාවිත වන පඩි, මිමි, කිරුම් හා මිනුම් උපකරණ, මිනුම් නීතිරීතිවලට අනුකූලව පවත්වාගෙන යන්නේදැයි පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂණ හා වැටලීම් සිදුකරනු ලැබේ. මෙම වැඩසටහන් පාරිභෝගික ආරක්ෂාවට මෙන් ම රට තුළ නිවැරදි මිනුම් පද්ධතියක් පවත්වාගෙන යාමටත් උපකාරීවේ.

1.3.3.4 පෙර ඇසුරුම් භාණ්ඩ පරීක්ෂා කිරීම

පාරිභෝගිකයාට අලෙවි කිරීමට පෙර, ඇසුරුම් කරන ලද භාණ්ඩ 'පෙර ඇසුරුම් භාණ්ඩ' (Pre - Packages) ලෙස හැඳින්වේ. පෙර ඇසුරුම් අයිතමයන්ගේ සඳහන්ව ඇති ප්‍රමාණයන් (බර, පරිමාව, දිග ආදිය) නියමිත පරිදි තිබෙන බව පරීක්ෂා කිරීමේදී නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර නිර්දේශ (OIML recommendations) අනුව පරීක්ෂණ සිදු කෙරේ. පෙර ඇසුරුම්

පරීක්ෂා කිරීමේ දී වෙළෙඳපොළේ ප්‍රදර්ශනයට තබා ඇති පෙර ඇසුරුම් නියදි ලෙස තෝරා ගෙන ඒවායේ අඩංගු ද්‍රව්‍යවල ශුද්ධ බර, ශුද්ධ පරිමාව හෝ දිග දළ අගය හා ඇසුරුමේ අගය මැන නිර්ණය කරනු ලැබේ. නිශ්චිත පෙර ඇසුරුම් සංඛ්‍යාවක් එලෙස පරීක්ෂාකර, එම මිනුම් සංඛ්‍යාන විශ්ලේෂණයකට (statistical Analysis) ලක් කරනු ලැබේ . OIML නිර්දේශ අනුව දෙපාර්තමේන්තුව මඟින් වරින්වර නිකුත්කරන විශේෂ ගැසට් නිවේදන වල දක්වා ඇති රෙගුලාසි වලට අනුකූලව පෙර ඇසුරුමේ ශුද්ධ මිනුම ඉඩදිය හැකි දෝෂය සමඟ පරීක්ෂා කර බලා අදාළ පෙර ඇසුරුම් පිළිබඳ අවසන් තීරණය ගනු ලැබේ. පෙර ඇසුරුම් පිළිබඳ තොරතුරු 2002.05.06 දිනැති අංක 1235/13 සහ 2007.05.29 දිනැති අංක 1499/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රවල පළකර ඇත.

1.3.3.5 නෛතික මිනුම් විද්‍යාවෙන් පාලනය වන වාණිජ ක්‍රියාකාරකම්වල නියැලෙන පෞද්ගලික ව්‍යවසායකයින්ගේ ලියාපදිංචිය

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනතේ 21 වැනි වගන්තියට අනුව යම් පඩියක්, මිම්මක් හෝ කිරුම් හා මිනුම් උපකරණ හෝ විකිණීම, නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම හෝ අලුත්වැඩියා කරනු ලබන ඕනෑම සංවිධානයක් හෝ පුද්ගලයෙකු හෝ ඒ සඳහා සෑම වර්ෂයකම ජනවාරි 01 දිනට පෙර දෙපාර්තමේන්තුවේ නම් ලියාපදිංචි කරවා ගත යුතුය. ඒ සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂකවරයා විසින් නිශ්චය කරනු ලබන ආකෘති පත්‍රයක් මගින් ඉල්ලුම් කළයුතු අතර, එයට නියමිත ගාස්තුවද ගෙවිය යුතුය. මෙවැනි ලියාපදිංචි කිරීමකදී ලබා දෙන ලියාපදිංචි සහතිකය එය නිකුත් කළ වසරේ දෙසැම්බර් 31 දිනෙන් අවලංගු වේ.


කිසියම් පුද්ගලයෙක් කිරුම් හෝ මිනුම් හෝ උපකරණ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ප්‍රථම තමන් ඒ සඳහා තිබිය යුතු සුදුසුකම් හා දක්ෂතා සම්පූර්ණ කර ඇති බව තහවුරු කිරීමට දෙපාර්තමේන්තුව විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. ඒ සඳහා නියමිත විභාග ගාස්තුද ගෙවිය යුතුය.

පඩි, මිමි, කිරුම් හෝ මිනුම් හෝ උපකරණ අලුත්වැඩියා කිරීමේදී අවශ්‍ය වන මෙවලම් හා උපකරණ අයදුම්කරු සතුව තිබේද යන්න පරීක්ෂා කරනු ලැබේ. ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් අදාළ අයදුම්කරුගේ වැඩපොළ/ කර්මාන්ත ශාලාව පරීක්ෂා කරනු ලැබේ.


එවැනි ස්ථාන පරීක්ෂාවකින්ද පසු සියලු පරීක්ෂණ පිළිබඳ අධ්‍යක්ෂවරයා සෑහීමකට පත්වන්නේ නම්, අදාළ පුද්ගලයා වෙත අලුත්වැඩියා කිරීම සඳහා වන ලියාපදිංචි සහතිකය නිකුත් කරනු ඇත. (වගු 18, 19) එම ලියාපදිංචි සහතිකය අන්සතු කළ නොහැකිය. ව්‍යාපාරයේ අයිතිකරු වෙනස් වුවහොත් සුදුසුකම් ලත් කාර්මික නිලධාරියෙකු සිටීම අනිවාර්යය වේ.

ලියාපදිංචි ගාස්තු ඇතුළු ලියාපදිංචි කිරීම් පිළිබඳ අනෙකුත් සියලුම තොරතුරු 2015.07.02 දිනැති අංක 1921/54 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇත.

1.4 සංවිධාන සටහන


සංවිධාන ව්‍යුහය - මිනුම් ඒකක, ප්‍රමිති හා ඡේදා දෙපාර්තමේන්තුව
දෙපාර්තමේන්තු ප්‍රධානී
දෙපාර්තමේන්තු නියෝජ්‍ය ප්‍රධානී
අභ්‍යන්තර විගණන අංශය
අධ්‍යක්ෂ කාර්යාල අංශය
සැලසුම් හා ප්‍රගති සමාලෝචන අංශය
ජාතික ආරක්ෂණ අංශය
සම්පත් කළමනාකරණ අංශය
මිනුම් පරීක්ෂණාගාර මෙහෙයුම් අංශය
සංවර්ධන අංශය
තාක්ෂණික සහාය අංශය
දිස්ත්‍රික් මිනුම් විද්‍යා සමන්වයීකරණ අංශය
කාර්මික මිනුම් විද්‍යා සමන්වයීකරණ අංශය
දිස්ත්‍රික් මේලකම්
දිස්ත්‍රික් මේලකම් කාර්යාල 25
ගිණුම් හා පුසම්පාදන අංශය
මෙහෙයුම් හා සහාය සේවා අංශය
පාරිභෝගික සේවා
මූල්‍ය
ගබඩා
පරිපාලන
මානව සම්පත් කළමනාකරණය
පුහුණු හා සංවර්ධන
ප්‍රසම්පාදන
ගබඩා කළමනාකරණය
ඉඩම් හා ගොඩනැගිලි
සාමාන්‍ය පරිපාලන
ප්‍රවාහන
සංරක්ෂණ
ගබඩා කළමනාකරණය
ඉඩම් හා ගොඩනැගිලි
ආරක්ෂක
පිරිසිදු කිරීම
ඉඩම් හා ගොඩනැගිලි
ඉඩම් හා ගොඩනැගිලි
ඉඩම් හා ගොඩනැගිලි

කාර්ය මණ්ඩල සංවිධාන සටහන



1.5 දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලවල සම්බන්ධතා තොරතුරු

දිස්ත්‍රික් කාර්යාලය	ලිපිනය	දුරකථන අංක
කොළඹ	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නාරාහේන්පිට, කොළඹ 5	0112-500987
ගම්පහ	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ	0332-221664
කළුතර	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර	0342-221765
පුත්තලම	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම	0322-266189
කුරුණෑගල	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල	0372-228770
කෑගල්ල	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල	0352-221323
රත්නපුර	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර	0452-226299
ගාල්ල	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල	0912-231211
මාතර	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර	0412-237079
හම්බන්තොට	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට	0472-256160
මොනරාගල	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොනරාගල	0552-277406
බදුල්ල	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල	0552-228200
නුවරඑළිය	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය	0522-235703
මහනුවර	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර	0812-239971
මාතලේ	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ	0662-222135
අනුරාධපුර	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර	0252-225190
පොළොන්නරුව	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොළොන්නරුව	0272-226706
මඩකලපුව	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව	0652-226584

දිස්ත්‍රික් කාර්යාලය	ලිපිනය	දුරකථන අංක
අම්පාර	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර	0632-222982
වව්නියාව	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වව්නියාව	0242-224816
යාපනය	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය	0212-217399
මුලතිවු	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මුලතිවු	-
මන්නාරම	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම	0242-224816
කිලිනොච්චිය	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිලිනොච්චි	-
ත්‍රිකුණාමලය	දිස්ත්‍රික් ලේකම්, මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය	0262-050800

වගුව අංක 5

1.6 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතනය/අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු



1.7.1 සාමාජිකත්ව

මිනුම් විද්‍යාවට අදාළ අන්තර්ජාතික හා කලාපීය සහයෝගීතාව පවත්වා ගැනීම සඳහා විවිධ රටවල් එකිනෙකා සමඟ මිනුම් විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් සම්බන්ධතා ඇතිකරගනු ලැබේ. ජාත්‍යන්තරය සමඟ මිනුම්වල අන්වේෂණතාව ස්ථාපිත කිරීමට සහ වෙළෙඳාමේ දී ඇති වන තාක්ෂණික බාධක ජය ගැනීමට ද එය උපකාරී වේ. අප සතුව ඇති විද්‍යාත්මක හා වෙනත් මිනුම් පිළිවෙත් සඳහා ආරක්ෂිත වූ පදනමක් සැපයීම සහ බොහෝ රටවල පැන නගින තාක්ෂණික ගැටලු අවම කිරීම සඳහා ජාත්‍යන්තර සබඳතා තවදුරටත් අත්‍යවශ්‍ය වේ.

මීටර් සම්මුතියේ හා පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනයේ (BIPM) ආශ්‍රිත සාමාජිකත්වය

මීටර් සම්මුතිය යනු, මිනුම් පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් ඒකමිතියක් පවත්වා ගැනීම සඳහා 1875 දී රටවල් 17 ක සහභාගීත්වයෙන් පවත්වන ලද සම්මේලනයකි. මීටර් සම්මුතිය මගින් පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනය (CGPM), සහ එහි අධිකාරිය යටතේ පඩි හා මිමි පිළිබඳ ජාත්‍යන්තර කමිටුව (CIPM) ආරම්භ වන අතර,අන්තර් රාජ්‍ය සංවිධානයක් වන ජාත්‍යන්තර පඩි හා මිමි කාර්යංශය (BIPM) නිර්මාණය වන්නේද මෙම ගිවිසුම යටතේය.

පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනය, සාමාජික රාජ්‍යයන්හි නියෝජිතයන්ගෙන් ද ආශ්‍රිත සාමාජිකයන්ගෙන් ද නිරීක්ෂකයන්ගෙන් ද සමන්විතය. එහි ප්‍රධාන කාර්යයක් වනුයේ ජාත්‍යන්තර ඒකක ක්‍රමයේ (SI) පැවැත්ම හා ප්‍රවර්ධනය සහතික කිරීම සඳහා අවශ්‍ය සාකච්ඡා හා පර්යේෂණ පැවැත්වීමය. පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනය සාමාන්‍යයෙන් වසර හතරකට වරක් පැරිසියේදී සමුළුවක් පවත්වනු ලබයි.

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මීටර් සම්මුතිය සඳහා අත්සන් කළ අතර, 2007 දී පඩි හා මිමි පිළිබඳ මහා සම්මේලනයේ ආශ්‍රිත සාමාජිකත්වය (Associate Member) ලබා ගන්නා ලදි.

CIPM අන්‍යෝන්‍ය පිළිගැනීම පිළිබඳ විධිවිධාන (CIPM-MRA) අත්සන් කිරීම.

CIPM අන්‍යෝන්‍ය පිළිගැනීම පිළිබඳ විධිවිධාන (CIPM - MPA) යනු ජාතික මිනුම් විද්‍යා ආයතන විසින් පවත්වාගෙන යනු ලබන මිනුම් ප්‍රමිතීන්ගේ හා ඔවුන් විසින් නිකුත් කරනු ලබන අංකශෝධන සහතිකවල සමානාත්මතාව ජාත්‍යන්තර වශයෙන් ප්‍රදර්ශනය කර ගැනීම සඳහා ඇතිකරගනු ලැබූ ගිවිසුමයි.

මෙහි ප්‍රතිඵලය වනුයේ ගිවිසුමට සම්බන්ධ වූ ආයතනයන්හි අන්තර්ජාතිකව පිළිගනු ලබන (අන්තර් ජාතික සමාලෝචකයන්ගේ අනුමැතිය ලැබූ) අංක ශෝධන හා මිනුම් පිළිබඳ හැකියාවන්ගේ අගයන් ය. (Calibration and Measurement Capabilities, CMC). අනුමත කරන ලද එම අගයන් හා තවත් තාක්ෂණික තොරතුරු (BIPM) වෙබ් අඩවියේ ඇති මූලික සන්සන්දන දත්ත සමුදායේ, KCDB හි ප්‍රසිද්ධ කර ඇත. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව 2007 දී CIPM - MRA

ගිවිසුම අත්සන් කළ අතර, මේ වන විට අංක ශෝධන හා මිනුම් පිළිබඳ හැකියා අගයන් (CMC) KCDB හි ප්‍රසිද්ධ කිරීම සඳහා පියවර ගෙන ඇත.

නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තරසංවිධානයේ (OIML) පූර්ණ සාමාජිකත්වය

නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය යනු, වෙළෙඳ අවහිරතා හා ලෝක වෙළෙඳ පොළෙහි වියදම් අවම කිරීම ආදිය සඳහා නෛතික මිනුම් විද්‍යා අධිකාරීන් හා කර්මාන්ත මගින් අන්‍යෝන්‍ය වශයෙන් පිළිගනු ලබන රෙගුලාසි, ප්‍රමිති හා අනෙකුත් අදාළ ලේඛන සකස් කිරීම සඳහා ඇතිකරනු ලැබූ අන්තර් රාජ්‍ය බැඳීමකි. නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ සංවිධානය ලෝක වෙළෙඳ සංවිධානයෙහි වෙළෙඳ ගිවිසුමෙහි තාක්ෂණික අවහිරතා පිළිබඳ "අන්තර් ජාතික ප්‍රමිති පිහිටුවන ආයතනය" ලෙස සැළකිය හැකිය. එම නිසා වෙළෙඳාම සහ වෙළෙඳ අවහිරතාව පිළිබඳ ගිවිසුම අත්සන් කර ඇති සියලු රටවල් විසින් OIML ප්‍රකාශ ඔවුන්ගේ තාක්ෂණික රෙගුලාසි සැදීමේදී සැළකිල්ලට ගත යුතුය.

නෛතික මිනුම් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර කමිටුව (CIML) යනු, OIMLහි තීරණ ගන්නා මණ්ඩලය වේ. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව OIMLහි පූර්ණ සාමාජිකත්වය දරන අතර, ශ්‍රී ලංකාව වෙනුවෙන් ස්ථිර සම්බන්ධිත ආයතනයද වේ.

ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනෙහි (APMP) පූර්ණ සාමාජිකත්වය

ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහන යනු, සාමාජික රටවල් අතර ප්‍රවීණතාව හා තාක්ෂණික සේවා හුවමාරු කරගනිමින් කලාපීය මිනුම් විද්‍යාත්මක හැකියාවන් වැඩිදියුණු කරගැනීම සඳහා ජාතික මිනුම් විද්‍යා ආයතනවලින් සැදුණු සංවිධානයකි. තවද APMP යනු මිනුම් ප්‍රමිති හා ක්‍රමාංකන සහ මිනුම් සහතික ලෝකය පුරා අන්‍යෝන්‍ය වශයෙන් පිළිගැනීම ලබා ගැනීම සඳහා සිදුකරනු ලබන ක්‍රියාවලියේදී පඩි හා මිමි පිළිබඳ ජාත්‍යන්තර කමිටුවේ (CIPM) හි පිළිගත් ආසියා ශාන්තිකර කලාපීය මිනුම් විද්‍යා සංවිධානය යි.

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව 1977 සිට ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනෙහි පූර්ණ සාමාජිකත්වය දරයි. දෙපාර්තමේන්තුව තාක්ෂණික කමිටු 9 ක් හා කේන්ද්‍රීය කණ්ඩායම් (Focus Group) 6 සඳහාම ක්‍රියාකාරීව සහභාගි වේ.

2021 වසරේ පැවති ආසියා පැසිපික් මිනුම් විද්‍යා වැඩසටහනේදී දියුණුවෙමින් පවතින රටවල් සම්බන්ධ කමිටුවේ සභාපති ධුරය ප්‍රථම වරට මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්.ඩී.අයි. ඩයස් මහතාට 2022 වසරේ සිට වසර 3ක කාලයක් සඳහා හිමිවිය.

1.7.2 ව්‍යාපෘතිවල ප්‍රතිලාභ

PTB - ශ්‍රී ලංකා ද්වි පාර්ශවික ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ ගුණාත්මක යටිතල පහසුකම් ශක්තිමත් කිරීම

PTB යනු ජර්මනියේ ජාතික මිනුම් ආයතනය (NMI) වේ. එය සංවර්ධනය වෙමින් පවතින හා නැගී එන රටවලට එම රටවල අවශ්‍යතාවන්ට සරිලන පරිදි ජාත්‍යන්තරව පිළිගත් ගුණාත්මක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වේ. PTB-ශ්‍රී ලංකා ද්වි පාර්ශවික ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ, උතුරු සහ උතුරු මැද කලාපයේ පිහිටා ඇති කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් (SME) විසින් කරන නිෂ්පාදන වල ගුණාත්මක භාවය සහතික කිරීමේ සේවාවන් වැඩිදියුණු කරවීමයි. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතියේ ජාතික මට්ටමේ ප්‍රධාන ව්‍යාපෘති හවුල් පාර්ශවයක් ලෙසට කටයුතු කරනු ලබයි. ජාතික මිනුම් පර්යේෂණාගාරය සඳහා පුහුණු, උපදේශන සේවා සහ මිනුම් කටයුතු සංවර්ධනය සඳහා මෙම ව්‍යපෘතියෙන් ප්‍රතිලාභ හිමිවේ.

මෙම ව්‍යාපෘතියට ජාතික තත්ත්ව යටිතල ව්‍යුහයේ ප්‍රධාන ආයතන (MUSSD, ITI, SLSI සහ SLAB) මෙන් ම කලාපීය රසායනාගාර, දේශීය මූලස්ථාන සහ උතුරු සහ උතුරු මැද පළාත් සංවිධාන ඇතුළත් ය.

SAARC - PTB ව්‍යාපෘතිය

දකුණු ආසියාවේ ගුණාත්මක යටිතල පහසුකම්, ක්ෂේත්‍රයේ කලාපීය ඒකාබද්ධතාව සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම

සාර්ක් සාමාජික රටවල් අතර විශේෂඥ දැනුම හා තොරතුරු හුවමාරු කර ගැනීමට පහසුකම් සැලසීම මඟින් ගුණාත්මක යටිතල පහසුකම්වල ධාරිතා සංවර්ධනය කෙරෙහි මෙම ව්‍යාපෘතිය අවධානය යොමු කරයි. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ජාතික මිනුම් ආයතනය ලෙස SAARC-PTB ව්‍යාපෘතියේ (එනම් පුහුණු වැඩසටහන්, වැඩමුළු) ප්‍රතිලාභියෙකි. තවද, ජාතික මිනුම් පර්යේෂණාගාරයේ (NML) මිනුම් හැකියාව ප්‍රදර්ශනය කිරීම සඳහා SAARC-PTB ව්‍යාපෘතිය යටතේ සංවිධානය කරන ලද අන්තර් සන්සන්දනවලට මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව සහභාගී වී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා PTB ආයතනය හරහා ජර්මනියේ ආර්ථික සහයෝගිතා හා සංවර්ධනය පිළිබඳ ෆෙඩරල් අමාත්‍යාංශය (BMZ) අරමුදල් සපයයි.

MEDEA-PTB ව්‍යාපෘතිය

ආසියාවේ කලාපීය මිනුම් විද්‍යා විශේෂඥයන් ජාලයේ ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහන (APMP) සහ ආසියා ශාන්තිකර නෛතික මිනුම් විද්‍යා සංසදය (APLMF) මඟින් සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ගේ මිනුම් විද්‍යාත්මක පද්ධති ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ අනුග්‍රාහකත්වය ලබා දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙම ව්‍යාපෘතියට ජාතික

මිනුම් විද්‍යා ආයතන (NML) හා නෛතික මිනුම් විද්‍යා අධිකාරීන් (LMA) විශේෂ දායකත්වයක් සපයයි. මෙම ව්‍යාපෘතිය සඳහා PTB ආයතනය හරහා ජර්මනියේ ආර්ථික සහයෝගිතා හා සංවර්ධනය පිළිබඳ ෆෙඩරල් අමාත්‍යාංශය (BMZ) අරමුදල් සපයයි.

UNIDO ව්‍යාපෘතිය

අනුකූලතාව සහ ගුණාත්මක යටිතල පහසුකම් සේවා ශක්තිමත් කිරීම සඳහා UNIDO ආයතනය ශ්‍රී ලංකාවේ ජාතික තත්ත්ව යටිතල පහසුකම් (NQI) සපයන ආයතන සමඟ සමීපව කටයුතු කරයි. විශේෂ අවධානය යොමුකළ අංශ වන්නේ කුළු බඩු සහ සැකසූ ආහාර වැනි අපනයන අරමුණු කරගත් අංශයි. මෙම ක්‍රියාකාරකම් යුරෝපා සංගමය විසින් අරමුදල් සපයනු ලබන යුරෝපීය සංගමයේ (EU) ශ්‍රීලංකාවේ වෙළෙඳාම ආශ්‍රිත ආධාර ව්‍යාපෘති රාමුව තුළ සිදුවේ. UNIDO සංවිධානයේ නව ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව සහ ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා ගුණාත්මක යටිතල පහසුකම් සපයමින් කටයුතු කරයි. මෙම ව්‍යාපෘතියේද මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව ප්‍රධාන ව්‍යපෘති හවුල්කරුවෙකු ලෙසට කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මගින් පුහුණු, උපදේශන සේවා, මිනුම් සංවර්ධන හා විදේශ ආධාර ලෙස මිනුම් විද්‍යාගාර සඳහා උපකරණ ලබාදෙනු ලැබේ.

2

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ

■ CMC ජාත්‍යන්තර පිළිගැනීම ලබාගැනීම

පරිමා මිනුම් විද්‍යාගාරය

තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) ස්ථාපිත කර නඩත්තු කිරීම මෙන් ම තාක්ෂණික අත්පොත සකස් කරමින් ISO/IEC 17025:2017 අවශ්‍යතා සපුරාලමින් පරිමා මිනුම් විද්‍යාගාරය සහ මානමිතික විද්‍යාගාරය ප්‍රතීතණය කිරීමට අප සමත් වී ඇත.

■ වෙළෙඳ දත්ත පද්ධතිය ස්ථාපනය කිරීම සහ මිනුම් උපකරණ මත ස්ටිකර් ඇලවීම

ලංකාව පුරා විසිරී පවතින සියලුම කිරුම් මිනුම් උපකරණ භාවිත කරන වෙළෙඳසැල්වල තොරතුරු ඇතුළත් කරමින් වෙළෙඳ දත්ත පද්ධතියක් සකස් කිරීමට අප දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

2023 වසරේ සිට අප දෙපාර්තමේන්තුව විසින් මිනුම් උපකරණ මුද්‍රා තැබීමේ සත්‍යායනය කරන ලද සෑම කිරුම් මිනුම් උපකරණයක් ම පාරිභෝගිකයාට හඳුනාගත හැකි පරිදි මිනුම් උපකරණවල ස්ටිකර් අලවනු ලැබේ. දැනට ස්ටිකර් 260,000ක් පමණ මුද්‍රණය කර, මෙම කාර්යය සඳහා දිස්ත්‍රික් කාර්යාල අතර බෙදා දී ඇත.

■ විකරණය කරන ලද බස් රථ දෙකක් මිලදී ගැනීම

සෑම වාණිජ කටයුත්තකදීම සිදු කරනු ලබන කිරුම් හා මිනුම් කටයුතු නියාමනය කිරීම සඳහා දිස්ත්‍රික් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශයක් සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් ම අනුබද්ධව පිහිටුවා ඇත.

ඉහත දිස්ත්‍රික් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අංශ මගින් ලබා දෙන සේවාවන් මහජනතාව වෙත ගෙන යාමේදී උද්ගතව තිබූ ප්‍රධාන ගැටලුවක් වූ ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැති වීමට පිළියමක් වශයෙන් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවලට සරිලන පරිදි විකරණය කරන ලද බස් රථ දෙකක් සපයා ගන්නා ලදී.

එම මිනුම් සේවා සපයනු ලබන ජංගම මිනුම් සේවා පරීක්ෂණාගාරයකින් සමන්විත බස් රථ මගින් දිස්ත්‍රික්කයක් තුළ පිහිටි සියලු ප්‍රදේශ ආවරණය වන පරිදි කාර්යක්ෂම සේවාවක් ලබා දීමට අප දෙපාර්තමේන්තුවට හැකියාව ලැබී ඇත.

විවිධ දෛනික මිනුම් සේවා රාජකාරි රැසක් එක් දිනකදී අවසන් කිරීමටත්, දෙපාර්තමේන්තු සේවාවන් පාරිභෝගික හිතකාමී කිරීමටත්, සේවාවන්හි ගුණාත්මක හා ප්‍රමාණාත්මක දියුණුවක් ලබා ගැනීමටද මෙමගින් හැකි වී ඇත.

2.1 ජාතික මිනුම් පර්යේෂණාගාරය තුළ මිනුම් අන්වේෂණතාව (MeasurementTraceability) ස්ථාපනය කිරීම

2023 වසර තුළ ජාතික මිනුම් පර්යේෂණාගාරය තුළ මිනුම් අන්වේෂණතාව ස්ථාපනය පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

ප්‍රමිතිය/මිනුම	*ජාතික මිනුම් විද්‍යා ආයතනය /ආශ්‍රය ප්‍රමිතීන් (Reference Standard)*
සම්මත ප්ලැටිනම් ප්‍රතිරෝධ උෂ්ණත්වමානය	ජාතික මිනුම් විද්‍යා ආයතනය එක්සත් රාජධානිය (NPL-UK)
pH මිනුම්	ද්විතීයික ස්වාරක්ෂක ද්‍රාවණ
සන්නායකතාව	ද්විතීය ප්‍රමිති සන්නායක ද්‍රාවණ
රුධිරයේ ඇති ඇල්කොහොල් ප්‍රමාණය	රුධිරයේ මධ්‍යසාර ප්‍රමිති ද්‍රාවණය (Certified Reference Material)
Cs පරමාණු ඔරලෝසුව	ජාත්‍යන්තර පඩි හා මිමි කාර්යාංශය (BIPM)
ආමාන කුට්ටි 00 ශ්‍රේණිය - සෙරමික් (0.5-100mm) ආමාන කුට්ටි 1 ශ්‍රේණිය - වානේ (0.1-1 mm) He/Ne ලේසර් ප්‍රභවය (රතු)	ජාතික මිනුම්විද්‍යා ආයතනය ෆින්ලන්තය (VTT MIKES)

වගුව අංක 06

2.2 අන්තර් විද්‍යාගාර සංසන්දනය සඳහා සහභාගී වීම (Inter Laboratory Comparisons)

විද්‍යාගාරය	*මිනුම්*	*අන්තර් සංසන්දනය*
උෂ්ණත්වමිතික	වීදුරු - ද්‍රව උෂ්ණත්වමාන PT 100 - 35 ^{0}C to 280 ^{0}C දක්වා	අන්තර් සංසන්දනය DEC APMP/TCT/ LIGT
කාලය හා සංඛ්‍යාතය	කාලය හා සංඛ්‍යාතය	CCTF-K001.UTC
පීඩනය	ද්‍රව පීඩනමානය (700 bar)	නේපාලය, උස්බෙකිස්ථානය, මොංගෝලියාව හා කිරිකිස්ථානය අතර අන්තර් සංසන්දනය සඳහා නියමු විද්‍යාගාරය ලෙස කටයුතු කර, එම රටවල් වලට ISO 17025 අනුව ප්‍රතිතනය ලබා ගැනීමට සහයෝගය දැක්වීම සඳහා පවත්වන ලද Regional Proficiency Testing (PT 01) හි අවසන් වාර්තාව නිකුත් කිරීම.
ස්කන්ධය	E 2 කිරුම් පඩි E 1 කිරුම් පඩි සමග (100 mg, 1 g, 50 g, 200 g & 1 kg)	NIMT සමග අන්තර් සංසන්දනය APMP.M.M.H1-2023

වගුව අංක 07

2.3 පර්යේෂණ හා සංවර්ධන කටයුතු - 2023

ජාතික මිනුම් පර්යේෂණාගාරයේ ඇති විවිධ මිනුම් ප්‍රමිති පවත්වාගෙන යාම හා ව්‍යාප්ත කිරීම පිළිබඳ පරීක්ෂණ සිදු කරනු ලබන අතර, එමගින් එම ප්‍රමිතිවල තත්ත්වය තහවුරු කරගැනේ. තවද කර්මාන්ත සඳහා භාවිත වන මිනුම් උපකරණ අංක ශෝධන සඳහා ක්‍රමවේද සංවර්ධනය ද නිරතුරුව සිදුවේ. ජාතික මිනුම් පර්යේෂණාගාරයේ එක් එක් අංශ වලට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු පහත පරිදි වේ.

ස්කන්ධමිතික මිනුම් විද්‍යා අංශය

- CCE 1000S-L ස්කන්ධ සංසන්දකයක් ස්ථාපිත කිරීම අවසන් කරන ලදි.
- උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පිළිබඳ තත් කාලීන නිරීක්ෂණ පද්ධතිය (IoT Project)
- ස්කන්ධමිතික විද්‍යාගාරය විසින් දිස්ත්‍රික් කාර්යාලවල හා ක්‍රමාංකන විද්‍යාගාරයේ මිනුම් අන්වේශණතාව ස්ථාපිත කිරීම වෙනුවෙන් කිලෝග්‍රෑම් 20 බරැති (M 1) කාණ්ඩයේ පඩි 40 ක් හා කිලෝග්‍රෑම් 20 බරැති (M 1)කාණ්ඩයේ පඩි 50ක් පර්යේෂණාගාරය වෙත ලැබිණි.
- ස්කන්ධමිතික විද්‍යාගාරය විසින් E2 පන්තිය, 1 මිලිග්‍රෑම් - 2 කිලෝග්‍රෑම් පඩි ක්‍රමාංකනය සඳහා ප්‍රතිතන සහතිකය ලබා ගැනීම සඳහා දෙසැම්බර් මස අයදුම්පත් භාර දෙන ලදි.

උෂ්ණත්වමිතික මිනුම් විද්‍යා අංශය

- වීදුරු - ද්‍රව උෂ්ණත්වමාන (Lights) වල අංක ශෝධන පරාසය -35 ºC සිට 280 ºC දක්වා වැඩි කරගැනීමට හැකිවීම.
- තාප විද්‍යුත් යුග්ම (Digital Temperature Probes) සඳහා නිරවද්‍යතාව 0.001 ºC සිට 0.000001 ºC දක්වා වැඩිකර ගැනීමට හැකිවීම.
- තාප විද්‍යුත් යුග්ම උෂ්ණත්වමාන අංක ශෝධනය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීම.
- වෙනස් මාධ්‍ය දෙකක් භාවිතා කරමින් රසදිය වීදුරු උෂ්ණත්වමාන වල නිරවද්‍යතාව තහවුරු කිරීම.
- වෙනස් දිශාවන් දෙකක් (සිරස් හා තිරස්) භාවිතා කරමින් විද්‍යුත් තාප යුග්ම වල නිරවද්‍යතාව තහවුරු කිරීම.
- වෙනස් මාධ්‍ය දෙකක් භාවිතා කරමින් ඉහළ උෂ්ණත්ව දත්ත ලොගර් වල නිරවද්‍යතාව තහවුරු කිරීම.
- ඉහළ උෂ්ණත්ව පරාස සඳහා වීදුරු - ද්‍රව උෂ්ණත්වමාන අංක ශෝධනයට අවශ්‍ය විද්‍යාගාර පද්ධතිය ස්ථාපනය කිරීම.

තෙතමනය හා ආර්ද්‍රතාව පිළිබඳ මිනුම් විද්‍යා අංශය

- කුරුඳු කර්මාන්තයේ දී භාවිත කරනු ලබන තෙතමන මාන (Moisture Meter) ක්‍රමාංකනය කිරීමට අදාළ ක්‍රමවේදය (Procedure) ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය වන පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලියක් ආරම්භ කිරීම.

මානමිතික මිනුම්විද්‍යා අංශය

- මීටර් කෝදු සම්බන්ධව පවත්නා අංක ශෝධන ක්‍රමය යාවත්කාලීන කිරීම.

  අංක ශෝධනයේ දී සිදුවන තාප බලපෑම සැලකිල්ලට ගනිමින් මීටර් කෝදු අංක ශෝධනයට අදාළ ගණිතමය ප්‍රකාශනය වෙනුවට නව ගණිතමය ප්‍රකාශනයක් ආදේශ කරන ලදී. එම නව ප්‍රකාශනයට අනුගත වන පරිදි අවිනිශ්චිතතා විශ්ලේෂණය ද සංශෝධනය කරන ලදී.

- K ශ්‍රේණියේ ටංස්ටන් කාබයිඩ් ආමාන කුට්ටි 11 ක කට්ටලයක් පළමු වරට අංක ශෝධනය කිරීම

  පළමු වරට සංසන්දනාත්මක ක්‍රමාංකනය සඳහා භාවිත කරන ලද K ශ්‍රේණියේ කොටස් 11ක කට්ටලයක් ක්‍රමාංකනය කිරීම. මෙම කට්ටලය අපගේ PTB අන්වේෂණතාව සහිත K ශ්‍රේණියේ කොටස් 11ක කට්ටලය සමඟ සංසන්දනය කරන ලදී.

- ආමාන කුට්ටි සන්සන්දක අංක ශෝධනය කිරීම පිළිබඳ මූලික අධ්‍යයනයක් කරන ලදී.

  ජර්මනියේ PTB හි මිනුම් අන්වේෂණතාව සහිත K ශ්‍රේණියේ විශේෂ ආමාන කුට්ටි කට්ටලය භාවිත කරමින් ආමාන කුට්ටි සංසන්දක අංක ශෝධනය පිළිබඳ අධ්‍යයනයක් කරන ලදී.

- දිගු ආමාන කුට්ටිවල ස්පර්ශක විරූපණය (Contact Deformation) හා ඒවායේ සිරස් හැකිළීම (Vertical Shrinkage) පිළිබඳ අධ්‍යයනය

  දිගු ආමාන කුට්ටි වල ස්පර්ශක විරූපණය (Contact Deformation) හා සිරස් හැකිළීමේ (Vertical Shrinkage) බලපෑම තීරණය කිරීම සඳහා අධ්‍යයනයක් කරන ලදී. සාමාන්‍ය භාවිතයේ දී මෙම සාධක දෙක අතිශයෙන් සැලකිය යුතු සාධක ලෙස නොසැලකේ. එබැවින් දිගු ආමාන කුට්ටි අංක ශෝධනයේ දී කේන්ද්‍රීය අපගමනයට බලපාන මෙම පරාමිතීන් දෙක අධ්‍යයනය කිරීම එහිදී බලාපොරොත්තු විය. මෙම බලපෑම අධ්‍යයනය කිරීම සඳහා පිළිගත් සමාගම් 3ක් විසින් නිෂ්පාදනය කරන ලද දිගු ආමාන කුට්ටි භාවිත කරන ලදී.

- මීටර් කෝදු අංක ශෝධනයට අදාළ මිනුම් හා අංක ශෝධන ශක්‍යතා (CMC) සංශෝධනය කිරීම.

  විශේෂඥ තක්සේරුව (Peer Review) සඳහා උපදෙස් ලබාදෙන ආචාර්ය C.S. Kang මහතාගේ උපදෙස් පරිදි මීටර් කෝදු අංක ශෝධන ආදර්ශ සමීකරණයට දිග පරායත්ත (Length Dependant) පදයක් එක් කිරීම මගින් සංශෝධනය කරන ලදී. ඒ අනුව මීටර් කෝදු අංක ශෝධනයට අදාළ මිනුම් හා අංක ශෝධන ශක්‍යතා CMC අලුතින් ගණනය කර නිර්ණය කරන ලදී.

- Cosine දෝෂය හා Abbe දෝෂය නිර්ණය කිරීම.

  මීටර් කෝදු අංක ශෝධනයේදී දක්නට ලැබෙන Cosine දෝෂයේ දායකත්වය ප්‍රමාණාත්මකව සෙවීමට අධ්‍යයනයක් කරන ලදී. මේ අවස්ථාවේදී මිලිමීටර් 2000 ක පරාසයක් තුළ BMG 2000 අංක ශෝධකයේ Abbe දෝෂය සොයා ගැනීමට Agilent 5519A ලේසර් ප්‍රමිතිය හා ඊට අදාළ ප්‍රකාශ උපාංග භාවිත කරන ලදී. මිලිමීටර් 0 සිට 2000 දක්වා පරාසයේ දෘෂ්‍ය පරීක්ෂාව මඟින් Cosine දෝෂය තීරණය කරන ලදී.

- මීටර් කෝදු අංක ශෝධනය කිරීමේදී තාප ස්ථායීතාවයේ බලපෑම.

  මීටර් 2 වානේ රූලක හා BMG 2000 අංක ශෝධකයේ තාප ස්ථායීකරණයේ හැසිරීම හඳුනාගැනීම සඳහා අධ්‍යයනයක් කරන ලදී. BMG 2000 අංක ශෝධකයේ සහ මීටර් 2 වානේ රූලෙහි වම් කෙළවරේ, මැද, සහ දකුණු කෙළවරේ උෂ්ණත්වය අඛණ්ඩව දින කිහිපයක් තිස්සේ මනින ලදී. BMG 2000 අංක ශෝධකයේ දකුණු කෙළවරේ උෂ්ණත්වය මෙන් ම කෝදුවේ දකුණු කෙළවරේ උෂ්ණත්වය ද බලාපොරොත්තු වූවාට වඩා අඩු උෂ්ණත්වයක පවතින බව සොයා ගන්නා ලදී. කාමරයේ ඇති වායු සමන යන්ත්‍රයේ වායු ප්‍රවාහයේ අවිධිමත් ව්‍යාප්තිය හේතුවෙන් මෙම උෂ්ණත්ව අපගමනය සිදු වන බව පැහැදිලි විය. එයට පිළියමක් ලෙස BMG 2000 අංක ශෝධකයේ මිනුම් බංකුවේ දකුණු කෙළවර ආවරණය වන පරිදි ඉදිරිපිට පොලි එතිලීන් සහිත විශාල තිරයක් හඳුන්වා දෙන ලදී.

- අංක ශෝධනය කරන විට කැලිපරවල උෂ්ණත්ව නැග්ම සිදුවන ආකාරය අධ්‍යයනය කිරීමට පරීක්ෂණයක් කරන ලදී.

  පරාසය මිලිමීටර් 150 සහ 300 වන විවිධ කැලිපර් මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී. එසේම තාපයට ඔරොත්තු දෙන විශේෂ අත් ආවරණයක සහ විද්‍යාගාරයේ සාමාන්‍ය භාවිතයේ ඇති අත්

ආවරණයක තාප සංක්‍රමණය ද මෙහි දී අත්හදා බලන ලදී. අත් ආවරණ යොදාගෙන කැලිපරයක් අල්ලාගෙන සිටියද කැලිපරයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 21 අබිබවා යන බව නිරීක්ෂණය විය. අත් ආවරණ සහිතව කැලිපරයක් විනාඩි 30 ක් තිස්සේ අල්ලාගෙන සිටි විට කැලිපරයේ උෂ්ණත්වය සෙල්සියස් 20 සිට 26 පමණ දක්වා වැඩි වන බව ද නිරීක්ෂණය විය. ඒ අනුව අත් ආවරණ පැළඳුව ද අංක ශෝධනය කරන අවස්ථාවේ දී අතේ තාපය කැලිපරයට සංක්‍රමණය වීම සම්පූර්ණයෙන් වලක්වා ගැනීමට නොහැකි බව නිගමනය වේ. එබැවින් කැලිපර් අංක ශෝධනයේ දී සිදු වන මෙම උෂ්ණත්ව නැග්ම ගැන පෙරට වඩා වැඩි අවධානයක් යොමුකළ යුතු බව තීරණය විය.

පරිමාමිතික හා පීඩනය පිළිබඳ මිනුම් විද්‍යා අංශය

- පරිමාමිතික හා පීඩනය පිළිබඳ විද්‍යාගාර එක්ව Infusion Pump/Syringe Pump යන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ භාවිතා කරන උපකරණ ක්‍රමාංකනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේද සැකසීමට හා එම ක්ෂේත්‍ර වලට ක්‍රමාංකන පහසුකම් ලබා දීමට අවශ්‍ය ක්‍රියාවලිය ආරම්භ කිරීම.

සරල ධාරා විද්‍යුතය පිළිබඳ මිනුම් විද්‍යා අංශය

- සරල ධාරා 1 mA සිට 20 A දක්වා මිනුම් වල කෙටි කාලීන ස්ථාවරත්වය සහ ඒවලනය, උපරිම ශක්‍යතාවය ඇගයීම.
- අනුපාත මිනුම් සහ සෘජු මිනුම් මගින් 1Ω, 100 Ω and 10 kΩ දක්වා මිනුම් වල කෙටි කාලීන ස්ථාවරත්වය සහ ඒවලනය, උපරිම ශක්‍යතාවය ඇගයීම.

පරිමාමිතික මිනුම් විද්‍යා අංශය

- නැහැසුම් ටැංකි භාවිතයෙන් OIMLR120 මාර්ගෝපදේශයට අනුව ප්‍රවාහ මාන අංක ශෝධනය කිරීම සඳහා තාක්ෂණික මාර්ගෝපදේශයන් සකස් කිරීම.

පීඩන මිනුම් විද්‍යා අංශය

- පාරිසරික වායුගෝලීය පීඩනය මැනීමට භාවිත කරන පීඩන උපකරණ ක්‍රමාංකනය සඳහා ක්‍රමවේදයක් හා උපකරණ සැලැස්මක් ස්ථාපිත කිරීම.
- ස්වයංක්‍රීය හා ස්වයංක්‍රීය නොවන රුධිර පීඩනමාන (Non-Invasive) පරීක්ෂාව

2.4 ජාතික මිනුම් පර්යේෂණාගාරය මගින් පැවැත්වූ පුහුණු සහ උපදේශනය වැඩසටහන් 2023

පුහුණු පාඨමාලාව	*ගාස්තු රුපියල්*	*සහභාගී වූවන් සංඛ්‍යාව*
Calibration of Weights and Uncertainty Calculation	30,000.00	04
Evaluation and Expression of Uncertainty in Measurement (for physical measurement)	127,500.00	17
Calibration of Pressure Gauges	67,500.00	09
Dimensional Metrology	82,500.00	11
Principle of Measurement Uncertainty & Application in Physical & Chemical Testing Fields	75,000.00	25
Calibration of Volumetric Apertures using Gravimetric Method	30,000.00	4
Evaluation and Expression of Uncertainty in Measurement (for physical measurement)	37,500.00	5

පුහුණු පාඨමාලාව	*ගාස්තු රුපියල්*	*සහභාගී වූවන් සංඛ්‍යාව*
Basic Course on Calibration of Electrical and Time & Frequency Instruments	112,500.00	15
එකතුව	562,500.00	90

වගුව අංක 08

- ✓ සංඛ්‍යාංක කාර්මික උෂ්ණත්වමාන නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීම හා පර්යේෂණ සංවර්ධන ක්‍රියාවලිය සිදුකිරීම. ඒ අනුව 2023 වසර තුළ උෂ්ණත්වමාන 18 ක් හා උෂ්ණත්ව සංවේදක 31 ක් විදේශ වෙළඳපොළ සඳහා ඉදිරිපත් කිරීම පිණිස සැකසුම් හා අංක ශෝධන සිදුකර ඇත.

- ✓ කොළඹ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨ සිසුන් 73ක් සඳහා අති නිරවද්‍ය මිනුම් පිළිබඳ දේශන හා වවුනියා විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨ සිසුන් 36 දෙනෙකු සඳහා ''මිනුම් විද්‍යාව'' පිළිබඳ දේශන පවත්වන ලදි.

- ✓ දේශීය විශ්වවිද්‍යාල සිසුන් සඳහා ලබා දෙන ආධුනිකත්ව පුහුණුව

දිනය	*ශිෂ්‍ය සංඛ්‍යාව*	*විශ්ව විද්‍යාලය*	*විද්‍යාගාරය*
2022.09.05-2023.03.05	01	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	පරිමාමිතික විද්‍යාගාරය
2022.09.05-2023.03.05	01	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	මානමිතික විද්‍යාගාරය
2022.09.05-2023.03.05	01	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	විද්‍යුත් බලය හා ශක්තිය පිළිබඳ විද්‍යාගාරය
2023.05.02-2023.07.21	01	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	
2022.09.05-2023.03.05	02	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	ස්කන්ධය පිළිබඳ විද්‍යාගාරය
2023.05.02- 2023.07.21	01	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	
2023.01.23-2023.03.23	01	ශ්‍රී ලංකා වවුනියා විශ්වවිද්‍යාලය	
2023.01.23-2023.03.23	02	ශ්‍රී ලංකා වවුනියා විශ්වවිද්‍යාලය	රසායනික මිනුම් විද්‍යාගාරය
2023.05.02- 2023.07.21	01	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	සරල ධාරා විද්‍යුතය පිළිබඳ විද්‍යාගාරය

වගුව අංක 09

2.5 ජාත්‍යන්තර සම්බන්ධතාවල ප්‍රගතිය - 2023

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මිනුම් විද්‍යාවට අදාළව පහත දැක්වෙන සංවිධාන හා ව්‍යාපෘති සමඟ ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා ගනී.

2.5.1 ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනේ (APMP -Asia Pacific Metrology Programme) පූර්ණ සාමාජිකත්වය

2023 වසරේදී අප දෙපාර්තමේන්තුව සහභාගිවී ඇති ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනේ වසර මැද සමුළුව (APMP Mid-year meeting) මොංගෝලියාවේ උලම්බටා නුවර

  2023 ජූලිමස 12 දින සිට 16 දින දක්වා

  මේ සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින්, ආසියානු පැසිපික් මිනුම් විද්‍යා වැඩසටහනේ සංවර්ධනය වෙමින් පවතින කමිටුවේ (DEC - Development Economy Committee) සභාපති ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්. ඩී. අයි. ඩයස් මහතා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්. ජී. එස්. ඒ. පෙරේරා මහතා සහභාගි වූහ.

- ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනේ වසර අවසාන සමුළුව (APMP End-year meeting)

  චීනයේ සෙන්ශේන් නුවර

  නොවැම්බර් මස 27 දින සිට දෙසැම්බර් 3 දින දක්වා

  මේ සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ආසියානු පැසිපික් මිනුම් විද්‍යා වැඩසටහනේ සංවර්ධනය වෙමින් පවතින කමිටුවේ (DEC - Development Economy Committee) සභාපති ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්. ඩී. අයි. ඩයස් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජේ. එස්. එම්. සිල්වා මහත්මිය සහ එච්. එල්. අයි. එස්. සම්පත් මහතා සහභාගී වීම.

- චීනයේ සෙන්ශේන් නුවර පැවති ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනේ (APMP) තාක්ෂණික කමිටු සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්. ඩී. අයි. ඩයස් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජේ. එස්. එම්. සිල්වා මහත්මිය සහ එච්. එල්. අයි. එස්. සම්පත් මහතා සජීවීව සහභාගී වූ අතර, අනෙකුත් කමිටු සමාජිකයන් වන දෙපාර්තමේන්තු නියෝජ්‍ය අධ්‍යක්ෂවරු මාර්ගගත ක්‍රමය ඔස්සේ සහභාගි වූහ.

තාක්ෂණික කමිටු

- ✓ TCT - උෂ්ණත්වය - අධ්‍යක්ෂ - එස්. එන්. අකුරන්තිලක මහතා
- ✓ TCL - දිග සහ මාන - නියෝජ්‍ය අධ්‍යක්ෂ - ඒ. ඩී. ඩී. නමින්ද මහතා
- ✓ TCM - ස්කන්ධය සම්බන්ධිත රාශීන් - නියෝජ්‍ය අධ්‍යක්ෂ - ජේ. එස්. එම්. සිල්වා මහත්මිය හා කේ. එස්. මල්ලවආරච්චි මහත්මිය
- ✓ TCTF - කාලය හා සංඛ්‍යාතය - නියෝජ්‍ය අධ්‍යක්ෂ - ආර්. ජී. එස්. ඒ. පෙරේරා මහතා
- ✓ TCQM - ද්‍රව්‍ය ප්‍රමාණය, රසායන විද්‍යාව, ජීව විද්‍යාව හා මිනුම් විද්‍යාව - නියෝජ්‍ය අධ්‍යක්ෂ - එස්. ඩී. අයි. ඩයස් මහතා
- ✓ TCEM - විද්‍යුත් හා චුම්බකත්වය- නියෝජ්‍ය අධ්‍යක්ෂ - ආර්. ජී. එස්. ඒ. පෙරේරා මහතා හා ආර්. ඩී. එම්. අලංක මහතා
- ✓ TCPR - ප්‍රකාශන මිතිය හා විකිරණ මිතිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ - ආර්. ඩී. එම්. අලංක මහතා
- ✓ TCFF - ද්‍රව්‍ය හා ප්‍රවාහ - නියෝජ්‍ය අධ්‍යක්ෂ - එච්. එල්. අයි. එස්. සම්පත් මහතා
- ✓ TCQS - තත්ත්ව පද්ධති - නියෝජ්‍ය අධ්‍යක්ෂ - ආර්. ජී. එස්. ඒ. පෙරේරා මහතා

Energy Efficiency Forcus Group - නියෝජ්‍ය අධ්‍යක්ෂ - ආර්. ඩී. එම්. අලංක මහතා හා චන්ද්‍රිකා ගරුසිංහ මිය සහභාගී වූහ.

- 2023 දෙසැම්බර් 2 දින හා 3 දින පැවති ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනේ වාර්ෂික මහ සභා සමුළුවට (Annual General Meeting) දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්. ඩී. අයි. ඩයස් මහතා සහභාගි විය.

- ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනේ අධ්‍යක්ෂ සමුළුවට දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ එස්. එන්. අකුරන්තිලක මහතා මාර්ගගත ක්‍රමය ඔස්සේ සහභාගි වූ අතර, ආසියානු පැසිපික් මිනුම් විද්‍යා වැඩසටහනේ සංවර්ධනය වෙමින් පවතින කමිටුවේ (DEC - Development Economy Committee) සභාපති ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්. ඩී. අයි. ඩයස් මහතා ද සහභාගි විය.

  ආසියානු පැසිපික් මිනුම් විද්‍යා වැඩසටහනේ සංවර්ධනය වෙමින් පවතින කමිටුවේ (APMP - DEC) වැඩසටහන

- APMP DEC Task Force යටතේ සංවිධානය වෙමින් පවතින කලාපීය රටවල්වල CMC Publish (Capabilities Measurement Capabilities) කිරීම සඳහා සහය දැක්වීම 2023 වර්ෂයේ සිදුකරන ලදි.

  ජාතික මිනුම් පර්යේෂණාගාරයේ, ස්කන්ධමිතික විද්‍යාගාරය එම වැඩසටහන සඳහා සහභාගි විය.

  මාර්ගගත උපදේශන මාතෘකාව : DEC Task Force for Support to Publish CMC's for Mass

  සම්පත් දායකත්වය: රන්සියා මහත්මිය - NIMT හි ස්කන්ධමිතිය පිළිබඳ උපදේශක

  පුහුණු කාලය : 2023 ජනවාරි 10 සිට 2023 දෙසැම්බර් 14 දක්වා

- APMP DEC Task Force යටතේ පහත පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වනු ලැබීය.

  ✓ මිනුම් සම්බන්ධ අවිනිශ්චිතතා ගණනය

  ✓ විද්‍යාගාර තත්ත්ව කළමනාකරණය ISO17025

  ✓ ස්කන්ධමිතිය පිළිබඳ නිර්දේශ R111

Mass Metrology, OIML Recommendation R111

Mass Metrology, Calibration of Mass Standard & Understanding of Calibration Certificate

*2.5.2 PTB (ජර්මානු ජාතික මිනුම් විද්‍යා ආයතනය - **Physikalisch Technische Bundesanstalt**) ශ්‍රී ලංකා ද්වීපාර්ශවීය ව්‍යාපෘතිය*

ආයතනය - ජර්මානු ජාතික මිනුම් විද්‍යා ආයතනය

ව්‍යාපෘතියේ නම - ජාතික තත්ත්ව යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - අදියර I/ II

Strengthening Quality Infrastructure in Sri Lanka - Phase I/ II (2016-2023)

PTB ව්‍යාපෘතියේ දෙවන අදියර මගින් ශ්‍රී ලංකාවේ ජාතික තත්ත්ව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සිදුකරනු ලැබීය. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතියේ ජාතික මට්ටමේ ප්‍රධාන ව්‍යාපෘති හවුල් පාර්ශවයක් ලෙස කටයුතු කරනු ලැබීය. එමගින් ජාතික මිනුම් පර්යේෂණාගාරය (NML) සඳහා පුහුණු, උපදේශක සේවා සහ මිනුම් කටයුතු සංවර්ධනය සඳහා විවිධ ආකාරයේ ප්‍රතිලාභ හිමි විය.

2023 වර්ෂයේ (PTB) ව්‍යාපෘතියේ සහය ඇතිව පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරනු ලැබීය.

- ස්කන්ධමිතික විද්‍යාගාරයේ නිලධාරීන්ට දෙදින උපදේශන වැඩසටහනක් ස්කන්ධමිතික විශේෂඥ ඇනට් මැටබඩ්ල් (Anett Matbadal) මහත්මිය විසින් පැවැත්වීම. (2023 අප්‍රේල් 25 සහ 26)

- ජාතික තත්ත්ව යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර අවසන් කිරීම නිමිති කොට ගෙන ජර්මානු ජාතික මිනුම් පර්යේෂණාගාරයේ ආසියානු කලාපයේ ප්‍රධානි ඌවේ මේස්නර් (Uwe Messner) මහතා 2023 දෙසැම්බර් 11 දින දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමග සාකච්ඡාවක් හා ජාතික මිනුම් පර්යේෂණාගාරයේ නිරීක්ෂණ චාරිකාවක ද නිරත විය.

- ජාතික තත්ත්ව යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය අවසන් කිරීමේ වැඩමුළුව 2023 දෙසැම්බර් 13 දින කොළඹ සිනමන් ලේක් සයිඩ් හෝටලයේ පැවැත්වූ අතර දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ඇතුළු නියෝජ්‍ය අධ්‍යක්ෂවරු ඊට සහභාගි වූහ.







2.5.3 MEDEA - PTB ව්‍යාපෘතිය

MEDEA - PTB ව්‍යාපෘතිය මඟින් ජාතික මිනුම් පර්යේෂණාගාරයේ ක්‍රියාකාරකම් සඳහා ලබා දී ඇති දායකත්වය

- ජූලි මාසයේ දී පීඩනමාන විද්‍යාගාරය මඟින් සංවර්ධනය කරනු ලැබූ කලාපීය අන්තර් සංසන්දනයන් සඳහා භාවිත කරනු ලබන, විද්‍යාගාරයේ උපකරණ ලබා දීම සඳහා හා ඒ සඳහා වාර්තා පිළියෙල කිරීමට මෙරටට පැමිණි පීඩනමාන විශේෂඥ තාවට් චන්පාන් (Tawat Changpan) මහතා සඳහා මූල්‍ය දායකත්වය සැපයීම.

- නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්. ඩී. අයි. ඩයස් මහතාට පෙබරවාරි මාසයේ දී තායිලන්තයේ බැංකොක් නුවර පැවති MEDEA - DEC උපායමාර්ගික සැලසුම් සමාලෝචන වැඩමුළුව (Strategic Plan Review Workshop) සඳහා සහභාගි වීමට මූල්‍ය දායකත්වය සැපයීම.

- නියෝජ්‍ය අධ්‍යක්ෂ, ආර්. ජී. එස්. ඒ. පෙරේරා මහතා සඳහා අගෝස්තු මාසයේ දී තායිලන්තයේ ජාතික මිනුම් විද්‍යාගාරයේ පැවති ඩිජිටල් ක්‍රමාංකණ සහතික පුහුණුව සඳහා මූල්‍ය දායකත්වය ලබා දීම.

- නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ජේ. එස්. එම්. සිල්වා මහත්මිය සඳහා අප්‍රේල් මාසයේ දී තායිලන්තයේ ජාතික මිනුම් විද්‍යාගාරයේ පැවති MEDEA - Calibration Capabilities for Infusion / Syringe pump analyzers පුහුණු වැඩසටහන සඳහා මූල්‍ය දායකත්වය සැපයීම.

- දකුණු කොරියාවේ ජාතික මිනුම් විද්‍යාගාරය හා ගෝලීය මිනුම් ඇකඩමිය හා සම්බන්ධව ජුනි මාසයේ කොරියාවේ පැවති Metrology in Acoustics, Ultrasound and Vibration පුහුණු වැඩසටහනට සහභාගි වීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ජේ. එස්. එම්. සිල්වා මහත්මියට මූල්‍ය දායකත්වය සැපයීම.

- අගෝස්තු මාසයේ දී තායිලන්ත ජාතික මිනුම් පර්යේෂණාගාරයේ පැවති Measurement of Sustainable Energy වැඩමුළුව සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්. ඩී. එම්. අලංක මහතා සහ මිනුම් පරීක්ෂණ නිලධාරිනී ජී. ඩී. එස්. සී. ගරුසිංහ මහත්මිය සඳහා මූල්‍ය දායකත්වය සැපයීම.

2.5.4 UNIDO ව්‍යාපෘතිය

සංවිධානය - එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය

ව්‍යාපෘතියේ නම - කෘෂි ආහාර අංශයේ සංවර්ධනය සඳහා ප්‍රමිති මත පදනම් වූ ප්‍රමුඛ භාවිතයන් ප්‍රවාහය කිරීමේ ව්‍යාපෘතිය. (2021-2023)

Mainstreaming Standard based best practices for Agri - Food sector development project.

සංවිධානයේ නව ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව හා ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා ගුණාත්මක යටිතල පහසුකම් සපයමින් කටයුතු කරයි. මෙම ව්‍යාපෘතියේ මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව ප්‍රධාන ව්‍යාපෘති හවුල්කරුවෙකු ලෙසට කටයුතු කරනු ලැබේ. මෙම

ව්‍යාපෘතිය මගින් විදේශ ආධාර ලෙස ජාතික මිනුම් පර්යේෂණාගාරයේ ඉහත ව්‍යාපෘතියට අදාළ මිනුම් විද්‍යා ක්ෂේත්‍ර සඳහා උපකරණ ලබා දෙනු ලැබේ.

2023 වර්ෂයේ (UNIDO) ව්‍යාපෘති සහය ඇතිව පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරනු ලැබී ය.

- තෙතමනය හා ආර්ද්‍රතාමිතික විද්‍යාගාරයේ නිලධාරීන් සඳහා ජනවාරි මාසයේ දී හා මැයි මාසයේ දී උපදේශක හාවියර් ගෝමස් (Xavier Gomez) මහතා විසින් උපදේශන වැඩසටහනක් පවත්වනු ලැබී ය.

- තෙතමනය හා ආර්ද්‍රතාමිතික විද්‍යාගාරයේ නිලධාරීන් සඳහා ජූලි මාසයේ දී දෙදින උපදේශන වැඩසටහනක් පවත්වනු ලැබී ය.

- තෙතමනය හා ආර්ද්‍රතාමිතික විද්‍යාගාරයේ නිලධාරීන් සඳහා සැප්තැම්බර් මාසයේ දී එක් දින උපදේශන වැඩසටහනක් පවත්වනු ලැබී ය.

- චීනයේ සෙන්ශේන් නුවර පැවති ආසියා ශාන්තිකර මිනුම් විද්‍යා වැඩසටහනේ (APMP) තාක්ෂණික කමිටු සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ එස්. ඩී. අයි. ඩයස් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජේ. එස්. එම්. සිල්වා මහත්මිය සහ එච්. එල්. අයි. එස්. සම්පත් මහතා සජීවීව සහභාගී වූ අතර, එම සමුළුවට සහභාගී වීම සඳහා මූල්‍ය දායකත්වය ලබා දීම.

2.5.5. UNIDO හා PTB ව්‍යාපෘති සුසංයෝගය

- PTB ව්‍යාපෘති නිලධාරීන් හා UNIDO ව්‍යාපෘති නිලධාරීන් ද්වීපාර්ශවීය ව සම්බන්ධ වී දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ඇතුළු නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සමඟ ව්‍යාපෘති පිළිබඳව සමාලෝචන රැස්වීමක් 2023 පළමු කාර්තුව තුළ දී දෙපාර්තමේන්තු පරිශ්‍රයේ දී පවත්වන ලදි. එහිදී ඔවුහු ජාතික මිනුම් පර්යේෂණාගාරයේ නිරීක්ෂණ චාරිකාවක ද නිරත වූහ.

- ජනවාරි මාසයේ දී පරිමාමිතික විද්‍යාගාරයේ Peer Review සඳහා සහභාගි වූ මිනුම් විද්‍යා විශේෂඥ ගෞතම් මන්ඩාල් (Goutam Mandal) මහතා සඳහා මූල්‍ය දායකත්වය සැපයීම.

- මැයි මාසයේ දී ස්කන්ධමිතික විද්‍යාගාරයේ පූර්ව විශේෂඥ තක්සේරුවක් හා දෙමුහුන් සංසන්දනයක් (Pre Peer Review and Hybrid Comparison) සඳහා සහභාගි වූ මිනුම් විශේෂඥ රන්සියා සුකෝම් මිය (Rungsiys Sukhon) සඳහා මූල්‍ය දායකත්වය සැපයීම. (2023 මැයි 23 සිට 2023 මැයි 29)


2.5.6. වෙනත් රැස්වීම්

- VTT MIKES ආයතනය සමඟ ආමාන කුට්ටි නිරෝධන මානයේ නව්‍යකරණය කිරීම පිළිබඳ පූර්ව සංවාදය මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී.

2.6 ජාතික මිනුම් පර්යේෂණාගාරයේ අංක ශෝධන ආදායම් තොරතුරු - 2023 වර්ෂය

මාසය	ස්කන්ධමිතික විද්‍යාගාරය		මානමිතික විද්‍යාගාරය		උෂ්ණත්වමිතික විද්‍යාගාරය		සරල ධාරා විද්‍යුතය පිළිබඳ විද්‍යාගාරය		විද්‍යුත් ජවය සහ ශක්තිය පිළිබඳ විද්‍යාගාරය		වායුන් පිළිබඳ විද්‍යාගාරය	
	ඒකක ගණන	ආදායම රුපියල්	ඒකක ගණන	ආදායම රුපියල්	ඒකක ගණන	ආදායම රුපියල්	ඒකක ගණන	ආදායම රුපියල්	ඒකක ගණන	ආදායම රුපියල්	ඒකක ගණන	ආදායම රුපියල්
ජනවාරි	17	586,000	14	181,000	132	389,927.50	13	38,000	3	28,500	6	3,000
පෙබරවාරි	36	175,200	4	15,500	45	67,290	1	6,000	42	44,400	0	0
මාර්තු	67	362,000	17	87,000	18	47,830	4	10,000	1	12,000	0	0
අප්‍රේල්	20	74,950	8	76,750	10	14,150	0	0.00	1	4,500	0	0
මැයි	116	407,700	26	62,150	26	75,020	6	28,500	8	15,500	0	0
ජූනි	36	169,950	19	46,900	20	38,880	3	18,500	1	12,000	0	0
ජූලි	46	209,200	19	47,500	7	28,300	8	53,000	3	126,000	21	69,300
අගෝස්තු	29	196,200	19	56,490	16	45,020	5	37,780	10	27,040	0	0
සැප්තැම්බර්	21	124,500	21	65,980	14	45,300	3	9,000	2	10,000	9	9,500
ඔක්තෝබර්	28	198,850	23	99,700	14	51,830	2	40,200	9	36,200	1	4,500
නොවැම්බර්	49	328,050	28	74,300	45	128,290	15	84,000	12	62,000	32	21,600
දෙසැම්බර්	44	281,700	27	80,360	109	241,370	8	23,000	26	110,600	7	3,500
එකතුව	**509**	**3,113,900**	**225**	**893,630**	**456**	**1,173,207.50**	**68**	**347,980**	**118**	**488,740**	**76**	**111,400**


වගුව අංක 10


අංක ශෝධන ආදායම (බදු රහිත)
මාසය
මුදල්
600,000
500,000
400,000
300,000
200,000
100,000
0
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝබර්
නොවැම්බර්
දෙසැම්බර්
ස්කන්ධමිතික
මානමිතික
උෂ්ණත්වමිතික
සරල ධාරා විද්‍යුතය
විද්‍යුත් සවිය සහ ශක්තිය
වායූන්

පුස්තාර අංක 1

මාසය	කාලය හා සංඛ්‍යාතය පිළිබඳ විද්‍යාගාරය		පරිමාමිතික විද්‍යාගාරය		පීඩනමිතික විද්‍යාගාරය		රසායනික විද්‍යාගාරය		ආර්ද්‍රතාමිතික විද්‍යාගාරය		බලය පිළිබඳ විද්‍යාගාරය	
	ඒකක ගණන	ආදායම රුපියල්	ඒකක ගණන	ආදායම රුපියල්	ඒකක ගණන	ආදායම රුපියල්	ඒකක ගණන	ආදායම රුපියල්	ඒකක ගණන	ආදායම රුපියල්	ඒකක ගණන	ආදායම රුපියල්
ජනවාරි	1	2,000	2	5,420	6	50,000	4	20,000	3	12,000	0	0
පෙබරවාරි	4	10,000	0	0	1	50,000	4	20,000	2	8,000	0	0
මාර්තු	1	2,000	23	13,100	19	81,000	5	25,000	1	4,000	0	0
අප්‍රේල්	1	2,000	0	0	1	5,000	2	10,000	2	8,000	0	0
මැයි	2	4,000	1	9,600	3	25,000	2	10,000	3	12,000	0	0
ජූනි	0	0	13	12,500	3	35,000	3	15,000	16	64,000	0	0
ජූලි	31	62,000	7	12,400	21	268,000	0	0	5	20,000	0	0
අගෝස්තු	2	4,400	8	17,400	4	135,000	2	10,000	0	0	0	0
සැප්තැම්බර්	2	4,800	9	14,400	0	0	1	5,000	2	8,000	1	1,500
ඔක්තෝබර්	6	12,400	10	17,360	12	145,000	2	10,000	0	0	1	1,500
නොවැම්බර්	4	9,600	2	12,683.50	11	150,000	3	15,000	6	24,000	0	0
දෙසැම්බර්	1	2,400	6	21,482.40	1	50,000	5	25,000	2	8,000	0	0
එකතුව	**55**	**115,600**	**81**	**136,345.90**	**82**	**994,000**	**33**	**165,000**	**42**	**168,000**	**2**	**3,000**

වගුව අංක 11


අංක ශෝධන ආදායම (බදු රහිත)
මාසය
මිලියන
300,000
250,000
200,000
150,000
100,000
50,000
0
කාලය හා සංඛ්‍යා
පරිගණනික
පිඩනමිතික
රසායනික
ආර්ද්‍රතාමිතික
බලය පිළිබඳ විද්‍යාගාරය

ප්‍රස්ථාර අංක 02

2.7 ජාතික මිනුම් පර්යේෂණාගාරයේ පෙර ඇසුරුම්, වායු විමෝචන හා වේගමාපක උපකරණ ආදායම

ජාතික මිනුම් පර්යේෂණාගාරය මඟින් අංක ශෝධන කටයුතුවලට අමතරව පෙර ඇසුරුම් භාණ්ඩ පරීක්ෂාව, වාහනවල වායු විමෝචන මනින උපකරණ සත්‍යාංකනය සහ වේගමාපක උපකරණ සත්‍යාංකනය ද සිදුකරනු ලබයි.


වර්ගය	ඒකක සංඛ්‍යාව	ආදායම
වේගමාපක උපකරණ	33	62,000.00
පෙර ඇසුරුම් භාණ්ඩ පරීක්ෂා (කර්මාන්තශාලා)	12	163,000.00
වායු විමෝචන මනින උපකරණ	1,149	5,745,000.00
එකතුව	1,194	5,970,000.000

වගුව අංක 12

2.8 පඩි, මිම්, කිරුම් හා මිනුම් උපකරණ මාදිලි අනුමැතිය - 2023 වර්ෂය

මාදිලි අනුමැති වර්ගය	2023 වර්ෂයේ මාදිලි අනුමැති ඉල්ලීම්	මාදිලි අනුමැති ලබාදුන් ඒකක සංඛ්‍යාව	සංශෝධිත උපකරණ	ආදායම
ඉලෙක්ට්‍රොනික් කිරුම් උපකරණ	64	44	-	1,376,340.00
ඉන්ධන පිරවුම් යන්ත්‍ර	6	7	-	170,000.00
එකතුව	70	51	-	1,546,340.00

වගුව අංක 13



ප්‍රස්තාර අංක 3

2.9 සත්‍යායන ආදායම් 2022 සිට 2023 දක්වා


දිස්ත්‍රික්කය	2022 සිට 2023 වසර දක්වා ලද ආදායම රුපියල්වලින් (බදු රහිත)	
	2022	2023
කොළඹ	18,458,117.12	25,492,338.00
ගම්පහ	31,385,136.81	36,488,962.57
කළුතර	11,206,639.57	13,414,780.00
ප්‍රධාන කාර්යාලය	57,422,930.37	83,172,144.61
	118,472,823.37	**158,568,225.18**
මහනුවර	19,998,186.72	21,906,850.00
මාතලේ	7,426,830.00	8,915,130.00
නුවරඑළිය	7,400,842.56	9,466,590.00
	34,825,859.28	**40,288,570.00**
ගාල්ල	9,897,530.61	13,175,477.22
මාතර	11,465,872.00	13,529,597.22
හම්බන්තොට	10,474,790.00	12,008,449.57
	31,838,192.61	**38,713,524.01**
මඩකලපුව	5,872,487.48	6,819,910.00
අම්පාර	9,880,164.35	10,509,557.57
ත්‍රිකුණාමලය	3,003,050.00	2,851,034.78
	18,755,701.83	**20,180,502.35**
කුරුණෑගල	20,507,823.65	25,486,893.48
පුත්තලම	7,942,069.57	10,459,876.00
	28,449,893.22	**35,946,769.48**
අනුරාධපුරය	13,312,175.30	15,902,670.00
පොළොන්නරුව	7,867,856.42	8,458,789.30
	21,180,031.72	**24,361,459.30**
බදුල්ල	12,605,350.00	13,704,842.00
මොණරාගල	8,530,889.07	9,905,390.00
	21,136,239.07	**23,610,232.00**
රත්නපුර	11,756,107.52	14,012,740.00
කෑගල්ල	9,256,101.79	11,220,640.00
	21,012,209.31	**25,233,380.00**
මුලතිවු	1,046,810.00	667,265.00
මන්නාරම	1,083,390.00	1,280,409.57
කිළිනොච්චිය	802,054.83	1,345,909.57
යාපනය	4,877,582.69	6,138,764.78
වව්නියාව	2,176,710.00	2,624,010.00
	9,986,547.52	**12,056,358.92**
එකතුව	**305,657,498.43**	**378,959,021.24**

වගුව අංක 14

සත්‍යායන වැඩසටහන් ආදායම් 2022-2023

මාසය	ආදායම රුපියල්		සත්‍යායනය කළ ඒකක සංඛ්‍යාව	
	2022 වර්ෂය	2023 වර්ෂය	2022 වර්ෂය	2023 වර්ෂය
ජනවාරි	27,167,373.00	32,216,769.13	42,501	40,458
පෙබරවාරි	31,846,102.00	39,004,866.17	51,394	48,550
මාර්තු	34,060,582.00	41,898,349.30	45,381	47,741
අප්‍රේල්	18,577,798.00	21,009,319.57	19,575	24,381
මැයි	14,999,341.00	31,649,467.48	18,240	34,027
ජුනි	17,642,182.00	28,420,120.78	21,661	29,919
ජූලි	8,174,907.00	28,940,394.17	8,092	30,116
අගෝස්තු	24,258,595.00	29,093,068.00	26,898	32,657
සැප්තැම්බර්	28,845,935.00	30,287,412.96	34,795	36,249
ඔක්තෝබර්	30,640,394.00	31,645,148.00	34,366	40,620
නොවැම්බර්	33,842,622.00	32,830,857.00	37,176	36,564
දෙසැම්බර්	35,601,667.00	33,230,198.00	38,743	33,489
එකතුව	**305,657,498.00**	**378,959,019.00**	**378,822**	**434,771**

වගුව අංක 15




ප්‍රස්තාර අංක 4

2.10 සත්‍යායනය කරන ලද ඒකක සංඛ්‍යාව 2020 - 2023

දිස්ත්‍රික්කය	සත්‍යායනය කරන ලද ඒකක සංඛ්‍යාව (2020-2023)			
	2020	2021	2022	2023
කොළඹ	79,813	77,773	57,387	75,532
ගම්පහ	45,861	45,830	29,802	34,105
කළුතර	16,803	9,539	12,725	14,744
	142,477	**132,132**	**99,914**	**124,381**
මහනුවර	49,934	29,825	30,293	39,694
මාතලේ	16,517	14,018	11,654	12,451
නුවරඑළිය	14,659	9,303	10,305	12,033
	81,110	**53,146**	**52,252**	**64,178**
ගාල්ල	24,143	16,114	14,629	17,280
මාතර	24,092	18,023	17,864	18,323
හම්බන්තොට	18,419	16,715	15,935	16,889
	66,654	**50,852**	**48,428**	**52,492**
මඩකලපුව	23,057	18,649	17,164	16,143
අම්පාර	20,574	17,029	16,640	17,553
ත්‍රිකුණාමලය	6,753	2,620	4,633	3,855
	50,384	**38,298**	**38,437**	**37,551**
කුරුණෑගල	38,536	27,963	26,418	30,969
පුත්තලම	12,188	8,561	8,933	11,022
	50,724	**36,524**	**35,351**	**41,991**
අනුරාධපුරය	26,303	22,362	18,197	19,988
පොළොන්නරුව	12,315	10,658	10,420	10,638
	38,618	**33,020**	**28,617**	**30,626**
බදුල්ල	21,435	17,953	17,323	18,371
මොණරාගල	22,217	17,771	16,321	16,617
	43,652	**34,480**	**33,644**	**34,988**
රත්නපුර	20,844	15,322	16,452	17,697
කෑගල්ල	15,584	11,193	12,432	14,381
	36,428	**26,515**	**28,884**	**32,078**
මුලතිවු	172	1,182	1,628	1,075
මන්නාරම	1,737	1,593	1,588	1,800
කිළිනොච්චිය	1,515	1,668	1,456	1,967
යාපනය	9,501	4,360	7,877	8,782
වව්නියාව	3,438	3,090	2,835	2,862
	16,363	**11,893**	**15,384**	**16,486**
එකතුව	**526,410**	**419,114**	**380,911**	**434,771**

වගුව අංක 16




ප්‍රස්තාර අංක 5


2.11 වැටලීම් සහ නඩු ප්‍රමාණය 2022-2023

මාසය	වැටලීම් සංඛ්‍යාව		පවරන ලද නඩු ප්‍රමාණය	
	2022	2023	2022	2023
ජනවාරි	1.233	579	36	13
පෙබරවාරි	784	2,075	35	139
මාර්තු	48	2,132	2	73
අප්‍රේල්	35	6,299	0	478
මැයි	0	2,129	0	86
ජුනි	0	2,753	0	126
ජූලි	2	1,844	0	61
අගෝස්තු	434	2,992	18	107
සැප්තැම්බර්	1,185	2,278	40	94
ඔක්තෝබර්	2,156	1,377	90	82
නොවැම්බර්	1,675	2,652	25	77
දෙසැම්බර්	1,174	3,078	27	96
එකතුව	**8,726**	**30,188**	**273**	**1,432**


වගුව අංක 17




ප්‍රස්තාර අංක 6



ප්‍රස්තාර අංක 7



ප්‍රස්තාර අංක 8



ප්‍රස්තාර අංක 9

2.12 දැනුවත් කිරීමේ වැඩසටහන - 2023

දිස්ත්‍රික්කය	ජනවා.	පෙබ.	මාර්.	අප්‍රේ.	මැයි	ජුනි	ජුලි	අගෝ.	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.	එකතුව
ප්‍රධාන කාර්යාලය කොළඹ	0	11	14	8	0	0	8	0	0	4	4	4	53
කොළඹ	11	8	12	16	29	0	11	7	4	11	9	1,005	1,123
ගම්පහ	0	0	0	0	0	0	0	0	2	0	0	0	2
කළුතර	0	0	2	0	3	0	3	0	1	5	0	0	14
පුත්තලම	0	0	0	2	2	2	2	2	2	3	6	10	31
කුරුණෑගල	3	5	7	20	8	0	5	4	0	5	10	8	75
කෑගල්ල	7	3	3	2	2	0	1	5	9	4	5	4	45
රත්නපුර	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
ගාල්ල	0	0	0	1	2	0	6	0	6	6	5	6	32
මාතර	0	0	0	5	0	0	0	6	6	6	6	0	29
හම්බන්තොට	3	6	5	7	5	5	0	4	5	5	25	77	147
මොණරාගල	2	4	2	6	4	6	4	2	2	3	3	10	48
බදුල්ල	20	15	25	25	14	35	15	35	60	30	45	45	364
නුවරඑළිය	0	0	0	0	0	0	0	0	0	0	3	0	3
මහනුවර	6	1	3	0	0	0	0	0	0	0	5	13	28
මාතලේ	6	5	5	6	8	8	3	0	0	0	6	4	51
අනුරාධපුර	3	8	12	15	3	0	0	6	8	5	0	0	60
පොළොන්නරුව	0	0	0	2	2	2	1	2	2	2	2	2	17
ත්‍රිකුණාමලය	0	1	0	0	0	0	0	0	0	0	0	0	1
මඩකලපුව	2	2	2	2	2	3	2	2	2	2	2	55	78
අම්පාර	2	3	3	3	2	3	5	4	5	4	4	22	60
වව්නියාව	1	1	2	0	0	0	0	0	0	0	0	0	4
යාපනය	0	0	0	0	0	0	0	0	0	0	2	0	2
මුලතිව්	0	0	0	0	0	0	0	0	0	0	0	35	35
මන්නාරම	2	1	1	2	0	0	3	0	0	0	2	0	11
කිළිනොච්චි	0	0	0	0	0	0	0	0	0	0	0	24	24
එකතුව	**68**	**74**	**98**	**122**	**86**	**64**	**69**	**79**	**114**	**95**	**144**	**1,330**	**2,343**

වගුව අංක 18

2.13 දැනුවත් කිරීමේ වැඩසටහන්වල කාර්තුමය ප්‍රගතිය - 2023 වර්ෂය

(ඉලක්කගත වැඩසටහන් සංඛ්‍යාව සහ පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව)

දිස්ත්‍රික්කය	ජනවාරි - මාර්තු		අප්‍රේල් - ජුනි		ජූලි - සැප්තැම්බර්		ඔක්තෝ - දෙසැ	
	ඉලක්කය	සාධනය	ඉලක්කය	සාධනය	ඉලක්කය	සාධනය	ඉලක්කය	සාධනය
ප්‍රධාන කාර්යාලය	12	25	12	8	12	8	12	12
කොළඹ	10	31	10	45	10	22	10	1,025
ගම්පහ	12	0	12	0	11	2	12	0
කළුතර	9	2	9	3	9	4	9	5
පුත්තලම	9	0	10	6	9	6	9	19
කුරුණෑගල	12	15	12	28	12	9	12	23
කෑගල්ල	9	13	10	4	9	15	9	13
රත්නපුර	9	0	9	0	10	0	8	0
ගාල්ල	9	0	10	3	9	12	9	17
මාතර	9	0	9	5	10	12	8	12
හම්බන්තොට	9	14	10	17	9	9	9	107
මොණරාගල	9	8	9	16	9	8	9	16
බදුල්ල	9	60	9	74	8	110	10	120
නුවරඑළිය	11	0	9	0	9	0	8	3
මහනුවර	9	10	12	0	11	0	12	18
මාතලේ	9	16	9	22	9	3	9	10
අනුරාධපුර	8	23	10	18	9	14	9	5
පොළොන්නරුව	8	0	7	6	8	5	7	6
ත්‍රිකුණාමලය	8	1	8	0	7	0	7	0
මඩකලපුව	8	6	8	7	7	6	7	59
අම්පාර	8	8	8	8	7	14	7	30
වව්නියාව	5	4	6	0	5	0	5	0
යාපනය	7	0	8	0	9	0	7	2
මුලතිව්	4	0	5	0	6	0	5	35
මන්නාරම	4	4	5	2	6	3	5	2
කිළිනොච්චි	5	0	5	0	5	0	5	24
එකතුව	221	240	231	272	225	262	219	1,569

වගුව අංක 19

2.14 වාණිජ ක්‍රියාකාරකම්වල නියැලෙන පෞද්ගලික ව්‍යවසායකයින්ගේ ව්‍යාප්තිය - 2023

දිස්ත්‍රික්කය	එක් එක් ව්‍යවසාය කාණ්ඩය අනුව ලියාපදිංචි සංඛ්‍යාව			
	නිෂ්පාදකයින්	ආනයනකරුවන්	විකුණන්නන්	අලුත්වැඩියාකරුවන්
කොළඹ	05	22	34	65
ගම්පහ	03	06	21	38
කළුතර	02	-	17	26
ගාල්ල	02	-	10	16
මාතර	-	-	05	09
හම්බන්තොට	-	-	03	07
මහනුවර	02	01	21	32
නුවරඑළිය	-	-	01	05
මාතලේ	-	01	06	03
බදුල්ල	-	01	08	18
කෑගල්ල	01	-	05	06
රත්නපුර	-	-	12	07
කුරුණෑගල	-	01	14	18
අනුරාධපුර	-	-	05	07
මොණරාගල	01	-	03	03
වව්නියාව	-	-	03	01
යාපනය	-	-	01	03
අම්පාර	-	-	07	05
මඩකලපුව	-	-	03	04
පොළොන්නරුව	-	-	03	02
පුත්තලම	-	-	06	05
ත්‍රිකුණාමලය	-	-	02	-
කිලිනොච්චි	-	-	01	01
මුලතිව්	-	-	-	01
මන්නාරම	-	-	01	-
එකතුව	16	32	192	182


වගුව අංක 20

2.15 වාණිජ ක්‍රියාකාරකම්වල නියැලෙන පෞද්ගලික ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම - 2023 වර්ෂය

ලියාපදිංචි වර්ගය	2023 වසරේ ලියාපදිංචි වූ සංඛ්‍යාව
කිරුම්/මිනුම් උපකරණ නිෂ්පාදකයින්	16
කිරුම්/මිනුම් උපකරණ අලුත්වැඩියාකරුවන්	182
කිරුම්/මිනුම් උපකරණ ආනයනය කර විකුණන්නන්	32
කිරුම්/මිනුම් උපකරණ විකුණන්නන්	192
එකතුව	422
ලියාපදිංචි ගාස්තු රුපියල්	1,269,900.00

(ඉහත වගුවේ ආදායම තුළ මුද්දරවල මුහුණත වටිනාකම ද ඇතුළත් වේ.)

වගුව අංක 21



ප්‍රස්තාර අංක 10

අභියෝග හා ඉදිරි ඉලක්ක

2023 වර්ෂය අභ්‍යන්තර අර්බුද රැසක නිමාව සමග පැමිණි නව වර්ෂයක් වූ අතර, දෙපාර්තමේන්තුවේ බොහෝ අරමුණුවල සංක්‍රාන්තික වෙනසක් හා ප්‍රගතියක් අපේක්ෂිත කාලපරිච්ඡේදයක් විය. ආර්ථික අර්බුද තත්ත්වය සමනයට අදාළ රාජ්‍ය වියදම් කළමනාකරණ මාර්ගෝපදේශ අනුව යමින් මිනුම් විද්‍යාව හා සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් ශක්තිමත් කරමින් අඛණ්ඩව නව්‍යකරණයන් සිදු කළ යුතු විය.

ශ්‍රී ලංකා රජය විසින් ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගනිමින් ඉදිරිපත් කර ඇති ජාතික උපාය මාර්ගික සැලසුම් විමසා බැලීමෙන් පසුව, දිළිඳුකම පිළිබඳ එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්කයන්ට අනුකූලව "ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක්" සඳහා වන උපාය මාර්ග සඳහා මිනුම් විද්‍යාව විශාල කාර්යභාරයක් ඉටු කරන බව අප විසින් හඳුනාගෙන ඇත. ඒ අනුව, පසුගිය ආර්ථික අර්බුදයේ උච්චතම අවස්ථාවන්හිදී පවා ආර්ථිකයේ වෙළෙඳ අංශය පුනර්ජීවනය කිරීම සඳහා අප විසින් විශේෂ අවධානයක් යොමු කළ අතර, ඒ අනුව 2023 වර්ෂය ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළඳාමේ විශ්වාසනීයත්වය සහතික කර ඇත. 2024 වර්ෂය තුළ දී 2023 වර්ෂයේ ලද අත්දැකීම් හා ජයග්‍රහණ මත පදනම් ව ජාතික ආර්ථිකය නංවාලීම සඳහා ඵලදායී මෙහෙයුම් රැසක් සිදු කිරීමට කාර්යසාධන ඉලක්ක සැලසුම් කර ඇත.

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

3

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන

සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය (ඒකාබද්ධ අරමුදල)

										එස්සිඒ-එෆ්
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා										
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය (ඒකාබද්ධ අරමුදල)										
								රු.		
සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023				සටහන		තත්‍ය				
						2023		2022		
-		ආදායම් ලැබීම්						-		
-		ආදායම් බදු		1				-		
-		දේශීය භාණ්ඩ හා සේවා මත බදු		2				-		එස්සිඒ-1
-		ජාත්‍යන්තර වෙළඳාම මත බදු		3				-		
-		බදු නොවන ආදායම් හා වෙනත්		4				-		
-		මුළු ආදායම් ලැබීම් (අ)						-		
-		ආදායම් නොවන ලැබීම්				-		-		
-		භාණ්ඩාගාර අග්‍රිම				164,300,000		166,958,388		එස්සිඒ-3
-		තැන්පතු				297,229		145,069		එස්සිඒ-4
-		අත්තිකාරම් ගිණුම්				7,225,245		6,214,614		එස්සිඒ-5
-		වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්				-		-		
-		මුළු ආදායම් නොවන ලැබීම් (ආ)				171,822,474		173,318,071		
-		මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)				171,822,474		173,318,071		
		භාණ්ඩාගාරයට ප්‍රේෂණ(ඇ)				19,879		148,975		
		ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ= (ඇ)-(ඇ)				171,802,595		173,169,096		
		අඩුකළා : වියදම්								
-		පුනරාවර්තන වියදම්						-		
177,000,000		වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ		5		168,606,864		168,067,485		
-		අනෙකුත් භාණ්ඩ හා සේවා		6		-		-		එස්සිඒ-2(ii)
2,800,000		සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්		7		1,066,601		1,253,170		
-		පොළී ගෙවීම්		8		-		-		

					රු.
සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023		සටහන	තත්‍ය		
			2023	2022	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
179,800,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		169,673,465	169,320,655	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	-	-	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	-	-	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
-	හැකියා වර්ධනය	14	-	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
-	මුළු මූලධන වියදම් (උ)		-	-	
	තැන්පතු ගෙවීම්		288,749	94,802	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		10,933,565	6,492,633	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (උ1)		11,222,314	6,587,436	
	මුළු වියදම් එ = (ඊ+උ+උ1)		180,895,779	175,908,091	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)		(9,093,184)	(2,738,995)	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(9,093,184)	(2,738,995)	ඒසීඒ-7
-	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය (මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදල)

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදල				
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ				
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය				
			2023	2022
		සටහන්	රු.	රු.
ආදායම්				
මුද්‍රා තැබීමේ ආදායම්		6	252,664,030	203,785,354
ක්‍රමාංකන ගාස්තු			4,452,239	3,175,986
සත්‍යාක්ෂණ ගාස්තු			3,333	21,333
මාදිලි අනුමැති ලැබීම්			917,560	267,253
ලියාපදිංචි ගාස්තු			466,027	1,697,933
පාඨමාලා ගාස්තු ලැබීම්			209,999	35,753
විභාග ගාස්තු			110,869	-
පොළී ආදායම්			120,876,722	33,664,953
වෙනත් ආදායම්			349,840	24,846
මුළු ආදායම			380,050,619	242.673,411
වියදම්				
අතිකාල දීමනා		7	1,950,814	1,779,689
ගමන් වියදම්		8	14,105,225	10,324,590
සැපයීම්		9	34,835,300	16,540,751
නඩත්තු වියදම්		10	17,403,445	14,876,264
ගිවිසුම්ගත සේවා		11	33,626,352	24,385,979
දායක මුදල් හා සාමාජික ගාස්තු			15,857,957	5,408,323
වෙනත් පුනරාවර්තන වියදම්			-	-
දේපළ, පිරියත හා උපකරණ ක්ෂය		12	85,182,516	89,024,846
මානව සම්පත් සංවර්ධන හා පුහුණු			1,726,069	1,761,581
දේපළ, පිරියත හා උපකරණ නඩත්තු		13	9,406,073	3,479,163
රාජ්‍යභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම			1,330	
මුළු වියදම්			214,095,081	167,581,186
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය			165,955,538	75,092,226

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (ඒකාබද්ධ අරමුදල) (ඒසීඒ - පී))


2023 දෙසැම්බර් 31 දිනට						
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය						
				තත්‍ය		
		සටහන		2023		2022
		_	_	රු.		රු.
මූල්‍ය නොවන වත්කම්						
දේපළ, පිරියත හා උපකරණ		ඒසීඒ-6		1,443,652,021		1,443,652,021
මූල්‍ය වත්කම්						
අත්තිකාරම් ගිණුම්		ඒසීඒ-5/5(ඒ)		26,484,798		22,776,479
මුදල් හා මුදල් සමාන දෑ		ඒසීඒ-3		-		-
මුළු වත්කම්				1,470,136,819		1,466,428,500
ශුද්ධ වත්කම් /ස්කන්ධය						
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්				(21,288,994)		(24,988,833)
දේපළ පිරියත හා උපකරණ සංචිතය				1,443,652,021		1,433,652,021
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය		ඒසීඒ-5(බී)				
ජංගම වගකීම්						
තැන්පතු ගිණුම්		ඒසීඒ-4		47,773,792		47,765,312
අග්‍රිම ශේෂය		ඒසීඒ-3		-		-
මුළු වගකීම්				1,470,136,819		1,466,428,500

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදල)

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදල			
2023 දෙසැම්බර් 31 දිනට			
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය			
		2023	2022
	සටහන්	රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	1	55,005,700	423,890,342
ලිපිද්‍රව්‍ය තොග		1,092,887	1,104,633
ලැබිය යුතු දෑ	2	25,214,023	5,640,712
තැන්පතු ගිණුම		200,000	200,000
ජංගම වත්කම්		82,512,610	430,835,688
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත උපකරණ	3	886,108,978	927,173,032
ස්ථාවර තැන්පතු		874,011,949	382,358,226
භා.නි.ලේ. තැන්පතු		47,773,792	47,765,312
ලැබිය යුතු දෑ		-	-
ජංගම නොවන වත්කම්		1,807,894,719	1,357,296,569
මුළු වත්කම්		1,889,407,329	1,788,132,257
බැරකම්			
ජංගම බැරකම්			
උපචිත වියදම්		4,493,637	6,321,132
භාණ්ඩාගාරයට ගෙවිය යුතු ආදායමෙන් 1/3	5	17,374,367	23,848,831
එකතු කළ අගය මත බදු		2,172,633	13,828,285
තැන්පතු ගිණුම		249,743	91,393
ගෙවිය යුතු අත්තිකාරම්		2,551	-
ජංගම බැරකම්		24,292,931	44,089,641
ජංගම නොවන බැරකම්			
මුළු බැරකම්		24,292,931	44,089,641
මුළු ශුද්ධ වත්කම්		1,865,114,398	1,744,042,616
හිමිකම් හා සංචිත			
සංචිත			
දේපළ පිරියත හා උපකරණ සංචිතය	22	36,700,007	36,700,007
		36,700,007	36,700,007
හිමිකම්			
සමුච්චිත අරමුදල		1,828,414,390	1,707,342,163
මුළු හිමිකම් හා සංචිත		1,865,114,398	1,744,042,616

වගුව අංක 24

පිටු අංක 56 සිට 60 දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 65 සිට 70 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි ම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමග සැසඳීම්කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමග එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.



3.3 මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය (ඒකාබද්ධ අරමුදල)

		ඒසීඒ-සී
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
	තත්‍ය	
	2023	2022
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	1,174,028	1,184,467
වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	164,300,000	166,958,388
අත්තිකාරම් අයකර ගැනීම්	774,096	-
තැන්පතු ලැබීම්	288,749	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	166,536,873	168,142,855

		එස්ඒ-සී
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
	තත්‍ය	
	2023	2022
	රු.	රු.
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	155,838,014	155,877,959
සහනාධාර සහ මාරුකිරීම්	1,066,601	1,253,170
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	4,779,128
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	19,879	148,975
අත්තිකාරම් ගෙවීම්	9,323,631	5,988,820
තැන්පතු ගෙවීම්	288,749	94,802
දෙපාර්තමේන්තු අරමුදලට පියවීම		-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	166,536,873	168,142,855
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)		-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම්		-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)		-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	-	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-

		එස්එල්-සි
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
	තත්‍ය	
	2023	2022
	රු.	රු.
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය (මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදල)

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදල			
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ			
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය			
		2023	2022
	සටහන්	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්			
ලැබීම්			
ආදායම් ලැබීම්	14	389,133,578	312,893,941
වෙනත් ලැබීම්	15	2,678,562	1,182,326
එකතු කළ අගය මත බදු		58,311,501	36,090,508
අත්තිකාරම් ලැබීම්	16	985,063	728,844
ගෙවීම්			
වියදම් ගෙවීම්	17	(136,603,254)	(69,274,104)
එකතු කළ අගය මත බදු		(65,367,570)	(29,904,439)
අත්තිකාරම් ගෙවීම්	18	(4,170,580)	(2,325,900)
උපචිත වියදම්	19	(69,635)	(5,856,346)
තැන්පතු ගෙවීම්		(279,750)	(83,325)
රිසිට් පත් අවලංගු කිරීම		(13,340)	
භාණ්ඩාගාරයට ගෙවිය යුතු ආදායමෙන් 1/3 ගෙවීම		(135,856,911)	(108,028,644)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත වූ මුදල් ප්‍රවාහය		109,056,495	135,422,861
ආයෝජන ක්‍රියාකාරකම්			
සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම		(270,000,000)	-
පොළී ලැබීම්	20	240,439	7,973,363
වත්කම් අත්පත් කර ගැනීම	21	(86,376,144)	(31,078,165)
මූලධන වත්කම් වැඩිදියුණු කිරීම	22	-	-
මානව සම්පත් සංවර්ධන වියදම්		(1,805,433)	(1,736,581)
ඉඩම්		-	-
බැංකු ඇපකරය		-	-
ආයෝජන ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහය		(357,941,138)	(24,841,383)
මූල්‍ය ක්‍රියාකාරකම්			
ණය ආපසු ලැබීම්			-
ස්ථාවර තැන්පත්		-	(50,000,000)
විශේෂ තැන්පත්		(120,000,000)	(200,000)
මූල්‍ය ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහය		(120,000,000)	(50,200,000)

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදල			
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ			
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය			
		2023	2022
	සටහන්	රු.	රු.
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		(368,884,643)	60,381,478
කාල පරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		423,890,343	363,508,865
කාල පරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		55,005,700	423,890,343

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් (ඒකාබද්ධ අරමුදල)

වාර්තා කිරීමේ පදනම

1. *වාර්තාකරණ කාලපරිච්ඡේදය*

   2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. *මිනුම්කරණ පදනම*

   මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

   මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. *ආදායම් හඳුනාගැනීම*

   හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. *දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම*

   වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

   දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. *දේපළ, පිරියත හා උපකරණ සංචිතය*

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණ වල අනුරූප ගිණුම වේ.

6. *මුදල් හා මුදල් සමාන දෑ*

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තා කිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් (මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදල)

2023/12/ 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් සටහන්

සටහන් අංක 01 මුදල් හා මුදල් සමාන දෑ	
මුදල් ශේෂය	54,642,193
සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුම	363,507
	55,005,700

සටහන් අංක 02 ලැබිය යුතු දෑ	
ඉන්ධන අත්තිකාරම්	560,000
සුළු මුදල් අත්තිකාරම්	10,000
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී	24,618,273
ලැබිය යුතු ආදායම්	-
අත්තිකාරම් ගිණුම-සත්‍යාක්ෂණ මුද්‍රා කටු	-
ලැබිය යුතු අවසර පත්‍ර ගාස්තු	25,750
	25,214,023

සටහන් අංක 04

ලියාපදිංචි ගාස්තුවලට අදාළ මුද්දර ආදායම මහා භාණ්ඩාගාරය විසින් තැන්පත් ගිණුමට බැරකර ඇත. එය සනාථ කෙරෙන භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අමුණා ඇත.

සටහන් අංක 05 භාණ්ඩාගාරයට ගෙවිය යුතු ආදායමෙන් 1/3

භාණ්ඩාගාරයට ගෙවිය යුතු ආදායමෙන් 1/3	
	-

සටහන් අංක 06 මුද්‍රා තැබීමේ ආදායම්

මුද්‍රා තැබීමේ ආදායම්	252,627,846
වැඩිපුර ලැබීම්-(මුද්‍රා තැබීම්)	36,184
	252,664,030

සටහන් අංක 07 දීමනා

අතිකාල දීමනා	1,950,814
	1,950,814

සටහන් අංක 08 ගමන් වියදම්

ගමන් වියදම් - දේශීය	11,380,937
ගමන් වියදම් - විදේශීය	2,724,288
	14,105,225

සටහන් අංක 9 සැපයීම්

ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	22,148,616
ඉන්ධන හා ලිහිසිතෙල්	11,677,962
නිල ඇඳුම්	121,302
වෙනත්	887,421
	34,835,300

සටහන් අංක 10 නඩත්තු වියදම්

වාහන	7,652,028
යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	9,535,537
ගොඩනැගිලි	215,880
	17,403,445

සටහන් අංක 11 ගිවිසුම්ගත සේවා

ප්‍රවාහන වියදම්	887,760
තැපැල් හා සංනිවේදන	2,821,910
විදුලිය හා ජලය	16,904,209
බදු කුලී හා පළාත්පාලන ආයතන බදු	423,295
වෙනත් ගිවිසුම්ගත සේවා	12,589,178
	33,626,352

සටහන් අංක 12 දේපළ පිරියත හා උපකරණ ක්ෂය

ගොඩනැගිලි ක්ෂය	29,066,175
වාහන ක්ෂය	3,704,148
යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ක්ෂය	47,751,916
ගෘහ භාණ්ඩ හා කාර්යාලයීය උපකරණ ක්ෂය	4,660,278
	85,182,516

සටහන් අංක 13 අළුත්වැඩියා වියදම්

ගොඩනැගිලි හා ඉදිකිරීම්	175,430
යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා	3,647,365
වාහන	5,583,278
	9,406,073

සටහන් අංක 14 ආදායම් ලැබීම්

මුද්‍රා තැබීම්	378,964,019
ක්‍රමාංකන ගාස්තු	6,805,663
ඉන්ධන	839,185
මාදිලි අනුමැති ගාස්තු	1,376,340
ලියාපදිංචි ගාස්තු	686,320
පාඨමාලා ගාස්තු	314,999
විභාග ගාස්තු	110,869
වැඩිපුර ලැබීම් (මුද්‍රා තැබීම්)	36,184
	389,133,578

සටහන් අංක 15 වෙනත් ලැබීම්

තැන්පතු ලැබීම්	58,350
වෙනත් ආදායම්	549,840
ඉන්ධන වියදම් ප්‍රතිපූරණය	1,264,557
ගමන් වියදම් ප්‍රතිපූරණය	468,699
පොලී ආදායම	
අධිභාර	337,116
	2,678,562

සටහන් අංක 16 අත්තිකාරම් ලැබීම්

ඉන්ධන අත්තිකාරම්	475,076
තත්කාර්ය අත්තිකාරම්	259,384
සුළු මුදල් අත්තිකාරම්	250,603
	985,063

සටහන් අංක 17 වියදම් ගෙවීම්

අතිකාල දීමනා	1,922,681
ගමන් වියදම් - දේශීය	13,822,505
ගමන් වියදම් - විදේශීය	493,305
ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ	21,486,372
ඉන්ධන හා ලිහිසිතෙල්	13,359,153
නිල ඇඳුම්	94,238
වෙනත් සැපයීම්	731,060
වාහන	7,862,030
යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු	13,941,558
ගොඩනැගිලි නඩත්තු	215,880
ප්‍රවාහන වියදම්	894,572
තැපැල් හා සන්නිවේදන	3,167,678
විදුලිය හා ජලය	18,332,730
වරිපනම් හා බදු	450,108
වෙනත් ගිවිසුම්ගත සේවා	12,237,776
දායක මුදල් හා සාමාජික ගාස්තු	11,880,760
රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම	1,330
ගොඩනැගිලි අලුත්වැඩියා	5,220,274
යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා	3,823,935
වාහන අලුත්වැඩියා	5,624,868
වැට්	1,019,466
ආදායමෙන් ආපසු ගෙවීම	20,975
	136,603,254

සටහන් අංක 18 අත්තිකාරම් ගෙවීම්

ඉන්ධන අත්තිකාරම්	1,995,240
තත්කාර්ය අත්තිකාරම්	1,595,340
සුළු මුදල් අත්තිකාරම්	580,000
	4,170,580

සටහන් අංක 19 උපචිත වියදම්

උපචිත වියදම්	69,635
සමුච්චිත අරමුදල	69,635

සටහන් අංක 20 ස්ථාවර තැන්පතු පොළී

ඉතිරි කිරීමේ ගිණුම පොළී	240,439
	240,439

සටහන් අංක 21 වත්කම් අත්පත් කර ගැනීම්

ගොඩනැගිලි	127,470
කාර්යාලීය උපකරණ	5,558,451
යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු	80,690,224
වාහන	-
	86,376,145

සටහන් අංක 22 දේපළ, පිරියත හා උපකරණ සංචිතය

එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන වැඩසටහන (UNIDO) යටතේ විද්‍යාගාරය වෙත පරිත්‍යාග වශයෙන් ලැබී ඇති විද්‍යා උපකරණ දේපල, පිරියත හා උපකරණ සංචිත ලෙස ගිණුම් ගතකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය (ඒකාබද්ධ අරමුදල)

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් (රු.) ඇස්තමේන්තුවේ % ලෙස
	- නැත -				

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ සාධනය (ඒකාබද්ධ අරමුදල)

රු. '000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	179,800,000	179,800,000	169,673,464	94%
ප්‍රාග්ධන	-	-	-	-

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. '000

අනු. අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල ප්‍රමාණයේ % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
		- නැත -				

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය (ඒකාබද්ධ අරමුදල)

වත්කම් කේතය	කේත විස්තරය	2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිල හා ව්‍යුහයන්	777,534,198	777,534,198	-	-
9152	යන්ත්‍රෝපකරණ/වාහන	305,642,823	305,642,823	-	-
9153	ඉඩම්	350,475,000	350,475,000	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	10,000,000	10,000,000	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TAC/F/MUSSD/23/FS/17 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය මිණුම් දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 298 මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත (සිංහල, ඉංග්‍රීසි, දෙමළ) මේ සමඟ එවා ඇත.

බී.ජී.අයි.නිරංජා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත:- 1. අධ්‍යක්ෂ, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. TAC/F/MUSSD/23/FS/17 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 මැයි 30 දින

අධ්‍යක්ෂ,

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 298 මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1 මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 298 මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අවෙනකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර නිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොනිබුණි.

	ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොනිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
(i)	1.6.3	භාණ්ඩාගාරයේ 52 වගුවේ සහ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් ලෙස රු. 6,214,614 ක් දක්වා නිබුණු අතර දෙපාර්තමේන්තු පොත් අනුව එය රු. 6,245,994 ක් වූයෙන් වෙනස රු.31,380 ක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ඇතුලත් කර නොනිබුණි.	1.6.1 (අ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම්

(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ අත්තිකාරම් ලැබීම් රු. 7,225,245 ක් වූ අතර භාණ්ඩාගාර වගුව **SA** 52 අනුව අත්තිකාරම් ලැබීම් වටිනාකම් රු. 7,674,867 ක් වූයෙන් රු. 449,622 ක් අඩුවෙන් දක්වා නිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්සුමට අනුව වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් රු. 8,118,607 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 1,174,028 ක් ලෙස සටහන් කිරීමෙන් රු 6,944,579 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.2 ප්‍රනරාවර්තන වියදම්

(අ) දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්ෂුමට අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු. 167,809,639 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 155,838,014 ක් ලෙස සටහන් කිරීමෙන් රු 11,971,625 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්ෂුමට අනුව වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම් රු. 197,925 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි.

1.6.3 අත්තිකාරම්

(අ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ප්‍රධාන ලෙජර් වියදම් යටතේ අත්තිකාරම් ගෙවීම් රු. 10,933,565 ක් දක්වා තිබූ අතර භාණ්ඩාගාර වගුව **SA** 52 හි සඳහන් අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 11,383,186 ක් වූයෙන් රු. 449,621 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්ෂුමට අනුව අත්තිකාරම් අයකර ගැනීම් රු. 8,336,761 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 774,096 ක් ලෙස සටහන් කිරීමෙන් රු 7,562,665 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්ෂුමට අනුව අත්තිකාරම් ගෙවීම් වටිනාකම රු. 11,661,324 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු. 9,323,631 ක් ලෙස සටහන් කිරීමෙන් රු 2,337,693 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.4 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

(අ) භාණ්ඩාගාර වගුව **SA** 52 අනුව අත්තිකාරම් ගෙවීම් රු 11,383,186 ක් වූ අතර දෙපාර්තමේන්තු පොත් අනුව එය රු. 11,661,324 ක් විය. රු. 278,138 ක් වූ වෙනස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර වගුව **SA** 52 අනුව අත්තිකාරම් ලැබීම් රු 7,674,867 ක් වූ අතර දෙපාර්තමේන්තු පොත් අනුව එය රු. 8,336,761 ක් විය. රු. 661,894 ක් වූ වෙනස අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ඇතුලත් කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්ෂුමට අනුව අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම් රු. 1,765,040 ක් වුවද එය අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ රු. 1,486,902 ක් ලෙස සටහන් කිරීමෙන් රු 278,138 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් වැය ලෙජරය හා නැන්පතු ලෙජරය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

2 මෙහෙයුම් සමාලෝචනය

2.1 කළමනාකරණ දුර්වලතා

2023 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් බී ගිණුමේ ගිහි ගිටි නිලධාරීන්ගේ ණය ශේෂ එකතුව රු.576,605 ක් වී තිබුණි එම ශේෂය තුල වසර තුනකට වැඩි මිය ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු. 147,429 ක ශේෂයක්ද, වැඩ නහනම් කරනු ලැබූ නිලධාරීන් තිදෙනෙකුගෙන් අය විය යුතු රු.217,570 ක ශේෂයක්ද, සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු වසර 05 ක් ඉක්මවන ලද රු. 211,606 ක ශේෂයක්ද පැවතුණි. මිය ගිය නිලධාරියාගේ ණය ශේෂය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4:6 වගන්තිය අනුවද සේවය අතහැර ගිය සහ වැඩ නහනම් කරනු ලැබූ නිලධාරීන්ගේ ශේෂ සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් ව [illegible]ල්ඛ 01/2020 ට අනුව වූ මාර්ගෝපදේශ අංක 01 හි (ඉ) ඡේදය ප්‍රකාරවද කටයුතු කර නොතිබුණි.

3 යහපාලනය

3.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටු කිරීම පිණිස සුදුසු අභ්‍යන්තර විගණකවරයෙකු පත්කල යුතු වුවද 2021 සැප්තැම්බර් 06 දිනෙන් පසු අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි.

4 මානව සම්පත් කළමනාකරණය

2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු හා පුරප්පාඩු සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

සේවක වර්ගය	අනුමත සංඛ්‍යාව	තනතුරු සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	19	09	10
තෘතීයික මට්ටම	30	02	28
ද්විතියික මට්ටම	216	190	26
ප්‍රාථමික මට්ටම	103	81	22
	368	**282**	**86**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්යමණ්ඩලය 19 ක් වූ අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය තනතුරු 08 ක්ද, සහකාර අධ්‍යක්ෂ (පාලන) - ශ්‍රී ලංකා පරිපාලන සේවය තනතුරු 01 ක්ද, ගණකාධිකාරි (අභ්‍යන්තර විගණන) - ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය තනතුරු 01 ක්ද ඇතුළුව 10 ක් එනම් සියයට 53 ක් 2011 වසරේ සිට පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) අනුමත තෘතීයික මට්ටමේ තනතුරු 30 ක් අතුරින් පරිපාලන නිලධාරි - කළමනාකරණ සේවා නිලධාරි සේවය (අධි ශ්‍රේණිය) තනතුරු 01 ක්ද සහකාර මූල්‍ය ඒකක ප්‍රමුඛ සේවා අධිකාරි - දෙපාර්තමේන්තුගත තනතුරු 04 ක්ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (අධි ශ්‍රේණිය) තනතුරු 23 ක්ද ඇතුළුව 28 ක් එනම් සියයට 93 ක් පුරප්පාඩුව පැවතුණි.

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

(අ) 2023 දෙසැම්බර් 31 දිනට පුළු තනුවන තනතුරු සංඛ්‍යාවෙන් එනම් සියයට 23 ක ප්‍රාප්තාඩර් පැවතුණු නොව එම පුාප්තාඩු සියල්ලම දෙපාර්තමේන්තුවන පුාප්තාඩු බව නිරීක්ෂණය විය.

ජී. ජී. පුේ. නිරෝෂා

ජී.ජී.අයි.නිරෝෂා

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TAC/F/MUSSDF/2023/11 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 27 දින

අධ්‍යක්ෂ,

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත්:- 1. ලේකම්, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් ආර්ථික ස්ථායීකරන සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. TAC/F/MUSSDF/2023/11 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 27 දින

අධ්‍යක්ෂ,
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) අරමුදලේ හඳුනානොගත් වියදම් ලෙස ඉකුත් වසරවල සිට පැවත එන රු. 47,301,127කට මිලදීගත් රසායනාගාර උපකරණ මේ වන විට භාවිතයට ගෙන නිබුණද, සමාලෝචිත වර්ෂයේදී මෙම උපකරණ, දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත නොකර ඉකුත් වර්ෂවල වියදම් ලෙස සමුච්චිත අරමුදලින් ගලපා නිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවන ලද එකතු වටිනාකම රු. 1,919,484 ක් වූ වියදම් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත නොකර, උපචිත වියදම් සඳහා ගෙවීමක් ලෙස සලකා ගලපා නිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී එකතු වටිනාකම රු. 1,133,327 ක් වූ ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවන ලද වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මුදල් පොතෙහි ශේෂයට සමාලෝචිත වර්ෂය දක්වා හඳුනා නොගත් ඍජු ප්‍රේෂණ ලැබීම් රු.9,989,864 ක් සහ හඳුනා නොගත් ගෙවීම් රු.1,474,211 ක් ගැලපීම් කර නිබුණද, ලැබීම් සහ ගෙවීම්වලට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ලැබීම් සහ ගෙවීම් සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ඈ) ස්ථාවර තැන්පතු සහතික අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 893,496,632 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර තැන්පතු ලෙස රු. 874,011,949 ක් දක්වා නිබුණෙන් එම ශේෂය රු. 19,484,683 ක් අඩුවෙන් දක්වා නිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම ලෙස රු. 120,876,722 ක් දක්වා නිබුණද, විගණනයේ ගණනය කිරීම් අනුව රු. 140,376,986 ක් වූයෙන් පොලී ආදායම රු. 19,500,264 ක් අඩුවෙන්ද දක්වා නිබුණි. තවද, ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ලෙස රු. 24,618,273 ක් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නිබුණ ද විගණනයේ ගණනය කිරීම් අනුව ලැබිය යුතු පොලී ආදායම රු. 27,539,122ක් වූයෙන් එය රු. 2,920,849 ක් අඩුවෙන් දක්වා නිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ලෙස රු. 4,493,637 ක් වෙන්කර නිබුණද, ඉදිරි වර්ෂයේ වවුචර් පරීක්ෂාවේදී උපචිත වියදම් එකතු වටිනාකම රු. 7,052,334 ක් වූයෙන් රු. 2,558,697 ක් අඩුවෙන් දක්වා නිබුණි.

(ඇ) එකතු කල අගය මත ගෙවිය යුතු රු.5,970,781 ක බදු මුදල, භාණ්ඩාගාරයට ගෙවිය යුතු ආදායම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය

සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි නනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත සේවා පනතේ 20 (1) (අ) සහ 37 වගන්තිය	වෙළඳාමේ භාවිතා වන සියලුම මිනුම් උපකරණ වාර්ෂිකව සත්‍යෝක්ෂණය කලයුතු වුවත් භාවිතා කරනු ලබන සෑම උපකරණයක්ම සත්‍යෝක්ෂණය කරන බව තහවුරු කර ගනිමේ නිසි ක්‍රමවේදයක් අරමුදල තුල මේ දක්වා ස්ථාපිත කර නොතිබුණි.

(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	රජයේ වාහන සෑම ඉන්ධන දහන පරීක්ෂාවකට පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසු හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකල යුතු වුවද දෙපාර්තමේන්තුවේ ඇති වාහන 13 ක් සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) මිනුම් ඒකක, ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුවේ විදුලි සෝපාන 02 ක් සේවාකරණය සහ නිසි ප්‍රමිතියෙන් නඩත්තු කිරීම සඳහා 2022 නොවැම්බර් 01 දින සිට 2023 ඔක්තෝබර් 31 දින දක්වා වසරක කාලයකට පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී තිබුණද, ගිවිසුම්ගත දින සිට මාස 08 ක කාලයක් ගිවිසුම්ගත මුදල වූ රු. 1,038,318 ක් ප්‍රමාද වී ගෙවීම හේතුවෙන් අදාල ගිවිසුම් ප්‍රකාරව විදුලි සෝපාන යන්ත්‍ර 02 සඳහා සේවා වාර 08 බැගින් සේවා වාර 16 ක් මඟ හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල වායුසම්කරණ යන්ත්‍ර 79 කට අදාලව සේවාකරණ ගිවිසුම්වලට එලඹී නොතිබීම හේතුවෙන් වර්ෂයක් වැනි කෙටි කාලයක් තුල යන්ත්‍ර කිහිප වරක් අලුත්වැඩියා කිරීම් සිදු කර තිබුණු අතර 2023 වර්ෂයේ වාර 36 ක් තුළ වායු සම්කරණ යන්ත්‍ර සඳහා රු. 2,137,590 ක අලුත්වැඩියා වියදම් දරා තිබුණි.

3.3 කාර්යසාධනය

අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටුකර ගැනීමට සැලසුම් කරන ලද කාර්යයන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපකරණ නිෂ්පාදකයින්, ආනයනකරුවන්, විකුණුම්කරුවන්, අලුත්වැඩියාකරුවන් ලියාපදිංචි කර ගැනීමේ ඉලක්කගත ප්‍රමාණය හා ආදායම ලබාගැනීම පිළිවෙලින් ඒකක 600 ක් සඳහා රු. මිලියන 15 ක් වූද සත්‍ය ප්‍රමාණය හා සත්‍ය හා ආදායම ඒකක 148 ක් හා රු.මි 0.69 ක් වී තිබුණි. මේ අනුව ඉලක්ක ගත ප්‍රමාණයේ සත්‍ය කාර්ය සාධනය සියයට 25 ක් පමණක් වී තිබුණි.

(ආ) දිස්ත්‍රික්ක 12 ක් තුල මිනුම් ප්‍රමිතීන් නැවත සත්‍යාක්ෂණ කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල දිස්ත්‍රික්ක 05 ක පමණක් එම කාර්යය ඉටුකර තිබිණි.

(ඇ) ආයතනික රාමුව ශක්තිමත් කිරීමේ පරමාර්ථය යටතේ මිනුම් ඒකක ප්‍රමිති සේවා පනත හා නීති රීති යාවත්කාලීන කිරීමේ ප්‍රගතිය සියයට 35 ක් වී තිබුණි.

(ඈ) දක්ෂ හා උගත් ප්‍රජාවක් ඇති කිරීම සඳහා මිනුම් දැනුම ව්‍යාප්ත කිරීම හා අන්තර් ආශ්‍රිත ආයතන අතර පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා ප්‍රදර්ශන පැවැත්වීම් සමාලෝචිත වර්ෂයේදී කොපමණ ප්‍රමාණයක් ඉටු කරනු ලබන්නේද යන්න සැලසුම්කර නොතිබුණු අතර ඒ යටතේ ප්‍රදර්ශන 02 ක් පමණක් පවත්වා තිබුණි.

(ඉ) සංවර්ධන හා පර්යේෂණ කටයුතු යටතේ මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධාරීන් 09 දෙනෙකුට පර්යේෂණ ව්‍යාපෘති 08 ක් භාරදී තිබූ අතර එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුල අවසන් කිරීමට සැලසුම් කර තිබුණද අදාළ ව්‍යාපෘති කටයුතු නිශ්චිත හේතු දැක්වීමකින් තොරව 2024 වර්ෂය දක්වා දිර්ඝ කර ගෙන තිබුණි.

3.4 ප්‍රසම්පාදන

සමාලෝචිත වර්ෂය තුල ආයතනයේ වාහනවල වාරානුකූල සේවා වාර 26 ක් සඳහා රු. 1,198,432 ක වියදම් දරා තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි 3.4 වගන්තිය අනුව සුළු වටිනාකමක් ඇති වැඩ හෝ සේවා ලබා ගැනීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන් අතරින් හෝ දුරකථන නාමාවලියේ කහ පිටු අතරින් තෝරාගත් සැපයුම්කරුවන් ලබාගත් ලංසු 03ක් හෝ 05 ක් අතරින් ඇගයීම් කර තෝරාගත් ලංසුකරුවන්ගෙන් අදාල සේවාව ලබා ගැනීමට කටයුතු නොකර සේවා වාර 17කට එකම සේවා ස්ථානයකින් සිදුකර රු827,570ක මුදලක් ගෙවා තිබුණි.

3.5 නිෂ්කාර්ය වත්කම්

දෙපාර්තමේන්තුවේ විද්‍යාගාර කාමර 66ක් සහිතව 2015 සිට ජාතික මිනුම් පර්යේෂණාගාරය පිහිටුවා තිබුණද වර්තමානයේ මිනුම් ක්ෂේත්‍ර 12 ක් සඳහා විද්‍යාගාර කාමර 33 ක් පමණක් ක්‍රියාකාරීව පවත්වාගෙන යන අතර ඉතිරි කාමර 33 ක් (වර්ග අඩි 140,060 ප්‍රමාණයක්) විගණිත දින දක්වා නිශ්කාර්යයව පවතින බව නිරීක්ෂණය විය.

ඩබලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

4

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශකය	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
සත්‍යායන ඒකක සංඛ්‍යාව	-	-	71.7%
සත්‍යායන ආදායම	-	85%	-
අංක ශෝධන ඒකක සංඛ්‍යාව	116%	-	-
අංක ශෝධන ආදායම	171%	-	-
පුහුණු වැඩසටහන් ආදායම	112%	-	-
මාදිලි අනුමැති සංඛ්‍යාව	-	85%	-
මාදිලි අනුමැති ආදායම	308%	-	-
පෞද්ගලික ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව	-	-	70.3%
පෞද්ගලික ව්‍යවසායකයින් ලියාපදිංචි කිරීම් ආදායම	-	80%	
පෙර ඇසුරුම් භාණ්ඩ පරීක්ෂණ සංඛ්‍යාව	-	-	28.5%
වැටලීම් සංඛ්‍යාව	180%	-	-
දැනුවත් කිරීම් වැඩසටහන් සංඛ්‍යාව	260%	-	-

වගුව අංක 22

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

5

තිරසාර සංවර්ධන අරමුණු (SDG)

5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50% - 74%	75% - 100%
අරමුණ 01 දුප්පත්කම දුරලීම 	■ කුඩාම වෙළඳපොළ වල පවා වෙළඳ සුරක්ෂිතතාවයක් ඇති කිරීම සියලුම ගොවීන්ට ඔවුන්ගේ නිෂ්පාදන සඳහා නිවැරදි ගෙවීමක් ලබා දෙන බවට සහතික වනු ඇත. ■ නිවැරදි මිනුම මඟින් ගෙවන ලද මිල පමණක් නොව, අපනයන සඳහා නිවැරදි බදු එකතු කිරීමට රජයන්ට හැකි බව සහතික වීම. ■ පෙර ඇසුරුම් කළ භාණ්ඩ පාලනය කිරීම තුලින් ප්‍රධාන වශයෙන් ආහාර ද්‍රව්‍ය පෙර ඇසුරුම් කිරීම වැඩිවෙමින් පවතින අවස්ථාවක ක්ෂේත්‍රයේ වංචා අවම කිරීමට උපකාරී වීම.	වසර තුළ ඉලක්ක ගත සත්‍යාපනය කළ ඒකක ප්‍රමාණය වසර තුළ අධීක්ෂණය කිරීමට බලාපොරොත්තු වූ පෙර ඇසුරුම් කළ භාණ්ඩ ප්‍රමාණය	 28.5%	71.7%	

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50%- 74%	75%-100%
අරමුණ 03 යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම 	■ සෞඛ්‍ය සේවාවේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම, ■ "ව්‍යාප්ත ධනාත්මක" සහ "ව්‍යාප්ත-සෘනාත්මක" පරීක්ෂණ ප්‍රතිඵල අවම කිරීම ■ රජයේ සහ සෞඛ්‍ය රක්ෂණකරුවන් සඳහා වන පිරිවැය අඩුකිරීම සහ සෞඛ්‍ය සේවයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම. ■ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හේතුවෙන් පුනරාවර්තන පරීක්ෂණ සංඛ්‍යාව අඩුකිරීම ■ ගුණාත්මක බවින් යුත් රෝග විනිශ්චය සඳහා වන පිරිවැය අඩු කිරීම.	වසර තුළ සෞඛ්‍ය අංශයට අදාළ උපකරණ සත්‍යාපනය හෝ අංක ශෝධනය කිරීමට බලාපොරොත්තු වූ ඒකක ප්‍රමාණය			උෂ්ණත්වමාන, පීඩනමාන හා වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ ස්කන්ධමිතික උපකරණ අංක ශෝධනය අවශ්‍යතාවය මත සිදු කර ඇත.
අරමුණ 07 දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය 	■ පරිසරයට නිකුත්වන CO_2 හා අනෙකුත් නුසුදුසු විමෝචන පාලනය කිරීම	වසර තුළ සත්‍යාපනයට ලක්කළ දුම්මාන ප්‍රමාණය			119%
අරමුණ 09 කර්මාන්ත නවෝත්පාදන හා යටිතල පහසුකම් 	■ කොටස් සහ නිමි භාණ්ඩ නිෂ්පාදනයේදී ගුණාත්මක භාවය තහවුරු කරන නියාමන අවශ්‍යතා, ලේඛන ප්‍රමිතීන් සහ පිරිවිතරයන් සපුරාලීම. ■ නිෂ්පාදන වටිනාකම සහ විශ්වසනීයත්වය ඇතුළුව පාරිභෝගික හා කාර්මික ගුණාත්මක අපේක්ෂාවන් සපුරාලීම.	වසර තුළ ඉලක්ක ගත අංක ශෝධන ප්‍රමාණය			116%

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% -49%	50%- 74%	75%-100%
	▪ CIPM MRA අවශ්‍යතා සපුරාලීම මඟින් වාණිජ පරීක්ෂණාගාර සඳහා ප්‍රමිතිකරණය ලබා ගැනීමට සහය වීම හා මිනුම් සහ පරීක්ෂණ ප්‍රතිඵල ජාත්‍යන්තරව පිළිගැනීම මඟින් නැවත නැවත පරීක්ෂා කිරීමෙන් තොරව වෙළඳ බාධක වළක්වා ගැනීම.	වසර තුළ ඉලක්කගත CIPM MRA අවශ්‍යතා සපුරාලීම සඳහා ගත් ක්‍රියාමාර්ග			ISO/IEC 17025 : 2017 අනුව CIPM-MRA හි එක් අවශ්‍යතාවයක් සපුරාලමින් පරිමා මිනුම් විද්‍යාගාරය ප්‍රතීතනය කිරීමට අප සමත් වී ඇත.

වගුව අංක 23

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

CIPM MRA යනු ලොව පුරා ජාතික මිනුම් විද්‍යා ආයතන සඳහා එකිනෙකාගේ මිනුම් ප්‍රමිතීන් සහ ක්‍රමාංකන සහතික හඳුනාගැනීම සඳහා ආයතනික සහ තාක්ෂණික රාමුව සපයන වේදිකාවකි. මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව යනු CIPM MRA නියෝජනය කරන ජාතික මිනුම් විද්‍යාගාරයයි. තත්ත්ව කළමනාකරණ පද්ධතිය (QMS) ස්ථාපිත කර නඩත්තු කිරීම මෙන්ම තාක්ෂණික අත්පොත සකස් කරමින් ISO/IEC 17025:2017 අනුව CIPM MRA හි එක් අවශ්‍යතාවයක් සපුරාලමින් මෙම වසර තුළ පරිමා මිනුම් විද්‍යාගාරය ප්‍රතීතනය කිරීමට අප සමත් වීම තුළින් වෙළඳ බාධක වළක්වා ගැනීමට හැකි වී ඇත. ඊට අමතරව වසර තුළ ඉලක්කගත අංක ශෝධන ප්‍රමාණය හා සත්‍යාපනයට ලක්කළ දුම්මාන ප්‍රමාණය අපේක්ෂිත මට්ටම ඉක්මවා යමින් කාර්යසාධනය ඉහළ නැංවීමට දායක වී ඇත.

අභියෝග

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 14/2022(I) හා 14/2022(II) යටතේ දේශීය/විදේශීය නිවාඩු ලබා දීම මත විද්‍යාගාරයේ තාක්ෂණික නිලධාරීන්ගේ තනතුරු පුරප්පාඩු වී ඇති අතර එය විද්‍යාගාරයේ කාර්යසාධනයට සෘජුව බලපා ඇත. එයට පිළියමක් ලෙස දෙපාර්තමේන්තු චක්‍රලේඛන මඟින් දේශීය/ විදේශීය නිවාඩු අත්හිටුවීමට අප තීරණය කර ඇත. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් විද්‍යාත්මක සේවයට සිදු කරනු ලබන බඳවාගැනීම් නියමිත පරිදි සිදු නොවීම අප මුහුණ පෑ විශාල අභියෝගයක් විය. එමෙන්ම ප්‍රතීතනය ලබා ගැනීම හා ප්‍රශස්ත මට්ටමේ අංකශෝධන ක්‍රියාවලියට සෘජුව බලපානු ලබන ජාතික මිනුම් පර්යේෂණාගාරයේ අති නිරවද්‍ය වායු සමීකරණ පද්ධතිය ස්ථාපනය කිරීමට අවශ්‍ය අනුමැතිය නොමැතිවීම හේතුවෙන් විශාල අර්බුදවලට අප මුහුණ දෙමින් සිටී.

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

6

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය - කාර්ය මණ්ඩල සංයුතිය - 2023

තනතුර	වැටුප් කාණ්ඩය	සේවා ගණය	පන්තිය	අනුමත තනතුරු සංඛ්‍යාව	වර්තමාන සේවක සංඛ්‍යාව			පවතින පුරප්පාඩු සංඛ්‍යාව
					ස්ථිර	කොන්ත්‍රාත්	වැඩ බලන	
ජ්‍යෙෂ්ඨ								
මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ	SL-1-2016	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	I	01	01	-	-	-
මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ	SL-1-2016	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	III/II/I ඒකාබද්ධ	15	07	-	-	08
සහකාර අධ්‍යක්ෂ (පාලන)	SL-1-2016	ශ්‍රී ලංකා පරිපාලන සේවය	III/II	01	-	-		01
ගණකාධිකාරි	SL-1-2016	ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය	III/II	01	01	-	-	-
ගණකාධිකාරි (අභ්‍යන්තර විගණන)	SL-1-2016	ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය		01	-	-	-	01
තෘතියික								
පරිපාලන නිලධාරි	MN-7-2016	කළමනාකරණ සේවා නිලධාරී සේවය (අධි ශ්‍රේණිය)		01	-	-	01	01
සහකාර මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධිකාරි	MN-7-2016	දෙපාර්තමේන්තුගත		04	-	-	-	04
සහකාර මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධිකාරි	MN-7-2016	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (අධි ශ්‍රේණිය)		25	02	-	10	23

තනතුර	වැටුප් කාණ්ඩය	සේවා ගණය	පන්තිය	අනුමත තනතුරු සංඛ්‍යාව	වර්තමාන සේවක සංඛ්‍යාව			පවතින පුරප්පාඩු සංඛ්‍යාව
					ස්ථිර	කොන්ත්‍රාත්	වැඩ බලන	
ද්විතීය								
මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධාරි	MN-4-2016	දෙපාර්තමේන්තු ගත		36	21	-	-	15
දිස්ත්‍රික් මිනුම් විද්‍යා විමර්ශණ සහකාර	MN-4-2016	දෙපාර්තමේන්තු ගත		03	03	-	-	-
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි	MN-6-2016	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය		01	-	-	-	01
සංවර්ධන නිලධාරි	MN-4-2016	සංවර්ධන නිලධාරි සේවය		60	60	-	-	-
පුස්තකාලයාධිපති	MN-3-2016	ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය		01	-	-	-	01
මිනුම් සේවා උපක්‍රම පරීක්ෂක	MN-3-2016	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය	III/II/I	91	86	-	-	05
රසායනාගාර සහකාර	MN-3-2016	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (දෙපාර්තමේන්තුගත)		04	-	-	-	04
කළමනාකරණ සේවා නිලධාරි	MN-2-2016	කළමනාකරණ සේවා නිලධාරී සේවය	III/II/I	20	20	-	-	-

තනතුර	වැටුප් කාණ්ඩය	සේවා ගණය	පන්තිය	අනුමත තනතුරු සංඛ්‍යාව	වර්තමාන සේවක සංඛ්‍යාව			පවතින පුරප්පාඩු සංඛ්‍යාව
					ස්ථිර	අනියම්	වැඩ බලන	
ප්‍රාථමික								
කාර්මික ශිල්පී	MT3/PL3-2016	දෙපාර්තමේන්තුගත		02	-	-	-	02
යාන්ත්‍රික ශිල්පී	PL3-2016	දෙපාර්තමේන්තුගත		02	02	-	-	-
රියදුරු	PL3-2016	ඒකාබද්ධ සේවය		17	15	-	-	02
මිනුම් ප්‍රමිති සේවා සහායක	PL2-2016	දෙපාර්තමේන්තුගත		63	53	-	-	10
රසායනාගාර සහායක	PL2-2016	දෙපාර්තමේන්තුගත		10	06	-	-	04
ලොරි සහායක	PL1-2016	දෙපාර්තමේන්තුගත		02	01	-	-	01
කාර්යාල කාර්ය සහායක	PL1-2016	කාර්යාල සේවක සේවය		05	04	-	-	01
මුරකරු	PL1-2016	දෙපාර්තමේන්තුගත		01	-	-	-	01
සනීපාරක්ෂක කම්කරු	PL1-2016	දෙපාර්තමේන්තුගත		01	-	-	-	01
එකතුව				**368**	**282**	-	**11**	**86**

වගුව අංක 24

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය/ අතිරික්තය බලපානු ලැබූ ආකාරය

ජාතික මිනුම් පර්යේෂණාගාරයේ සේවය සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය) තනතුරු සහ මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධාරී (දෙපාර්තමේන්තුගත), විද්‍යාගාර සහකාර හා විද්‍යාගාර සහායක යන තනතුරු සඳහා විශාල මානව සම්පත් පුරප්පාඩු පවතී. මෙම අනුමත කාර්යය මණ්ඩලවල දැනට පවතින පුරප්පාඩු සමස්ත සංඛ්‍යාවෙන් 50% පමණ වේ. විද්‍යාගාර සහකාර තනතුරුවල පුරප්පාඩු ප්‍රතිශතය 100% කි. මිනුම් පර්යේෂණාගාරයේ ඉදිරි සංවර්ධන හා සේවා ප්‍රවර්ධන කටයුතු සඳහා ද දැනට ලබාදෙන මිනුම් විද්‍යාත්මක සේවා (අංක ශෝධන, සත්‍යායන, මාදිලි අනුමැති) කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා ද ඉහත සඳහන් කළ පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් බඳවාගැනීම කඩිනමින් කළ යුතුව ඇත. අලුත් මිනුම් පරාමිතීන් සඳහා මිනුම් ප්‍රමිතීන් ස්ථාපනය කිරීම හා අලුත් මිනුම් විද්‍යාත්මක සේවා සැපයීම ආරම්භ කිරීමට තිබෙන නමුත් මෙම නිලධාරී හිඟය නිසා ඒවා සිදුකර ගැනීමට නොහැකි වීමේ ගැටලුවට අප මුහුණ පා ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

ආයතනය තුළ රාජකාරී කටයුතු කරගෙන යාමේදී ඊට අදාළ වන්නා වූ දැනුම නිලධාරීන්ට ලබා දීම හේතුවෙන් ආයතනයේ රාජකාරී කටයුතු වෙනදාට වඩා කාර්යක්ෂමව හා නිවැරදිව ඉටු කිරීමට හැකියාව ලැබෙන අතර ඒ මඟින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය වැඩිවේ.

පර්යේෂණාගාරයේ කාර්යයන් කිරීම සඳහා එක් එක් ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික දැනුම ලබා ගැනීම හා යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව දේශීය/ විදේශීය තාක්ෂණික පුහුණු ලබා දීම තුළින් පර්යේෂණාගාරයේ කටයුතුවල කාර්යසාධනය ඉහළ නැංවෙන අතර එක් එක් නිලධාරීන්ට පවරා ඇති රාජකාරීන්ට අනුව පුහුණුවීම් ලබා දීම තුළින් ඔවුන්ට අයත් රාජකාරීන් නිවැරදිව, ක්‍රමවත්ව හා දැනුවත් භාවයෙන් යුතුව ඉටු කිරීමට හැකිවීම තුළින් සමස්ත දෙපාර්තමේන්තුවේම කාර්යසාධනය ඉහළ නැංවීමට එය උපකාරී වේ.

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (පැය ගණන)	සමස්ත ආයෝජනය (රු '000)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	Advance certificate in Transport Management	1	180	රු. 60,000.00	-	දේශීය	Knowledge of Transport Management
02	Advance MS Excel Skills	14	12	රු. 182,000.00	-	දේශීය	Knowledge of MS Excel
03	Awareness Training on Accreditation of Reference material Producers as per ISO 17034	3	12	රු. 30,000.00	-	දේශීය	Knowledge of Accreditation of Reference material Producers as per ISO 17034
04	Calibration of pressure balance using EURAMET cg-3-method A and Absolute pressure measurement using pressure balance	3	24	රු. 0.00	-	දේශීය	Knowledge of Calibration of pressure balance using EURAMET cg-3-method A and Absolute pressure measurement using pressure balance
05	Corporate plan Development	1	6	රු. 12,500.00	-	දේශීය	Knowledge of Corporate plan Development
06	Database Management in Ms Access	6	12	රු. 78,000.00	-	දේශීය	Knowledge of Data base Management in MS Access
07	Ethics and Disciplines for Driver and Minor staff	2	12	රු. 19,000.00	-	දේශීය	Knowledge of Ethics and Disciplines for Driver and Minor staff
08	Law Training	16	12	රු. 292,800.00	-	දේශීය	Knowledge of Law
09	Management Skills Development	5	18	රු. 195,000.00	-	දේශීය	Knowledge of Management Skills

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (පැය ගණන)	සමස්ත ආයෝජනය (රු '000)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
10	Principals of Internal Auditing Procedure	1	12	රු. 7,500.00	-	දේශීය	Knowledge of Principals of Internal Auditing Procedure
11	Procurement Procedure	1	12	රු. 22,000.00	-	දේශීය	Knowledge of Procurement Procedure
12	Salary Conversions	1	12	රු. 7,500.00	-	දේශීය	Knowledge of Salary Conversions
13	Tamil Course	27	100	රු. 75,000.00	-	දේශීය	Knowledge of Tamil
14	Workshop on Disciplinary Procedure	2	12	රු. 19,000.00	-	දේශීය	Knowledge of Disciplinary Procedure
15	Workshop on Evidence law (Online)	30	12	රු. 84,000.00	-	දේශීය	Knowledge of Evidence law
16	Workshop on Statistical Inference for Scientific Research	39	6	රු. 30,000.00	-	දේශීය	Knowledge of Statistical Inference for Scientific Research
17	Internal Auditing of Laboratory Quality Management Systems as per ISO/IEC 17025: 2014	1	6	රු. 0.00	-	දේශීය	Knowledge of Internal Auditing of Laboratory Quality Management Systems as per ISO/IEC 17025: 2014
	මුළු පිරිවැය			රු. 1,114,300.00			

වගුව අංක 25

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (පැය ගණන)	සමස්ත ආයෝජනය (රු '000)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	MEDEA-APMP DEC Strategic Plan Review Workshop	1	24 Hours	-	-	Foreign	Knowledge regarding "Strategic Plan"
02	Post-Measurement Workshop for the project "Building Laboratory Capabilities to Assure Water Quality in Asia Pacific Economies"	1	24 Hours	-	-	Foreign	Knowledge regarding "Building Laboratory Capabilities to Assure Water Quality in Asia Pacific Economies"
03	MEDEA: Metrology – Enabling Developing Economies in Asia "Training Course on Calibration Capability for Infusion/Syringe Pump Analysers" -2nd Workshop	1	18 Hours	-	-	Foreign	Knowledge regarding "Calibration Capability for Infusion/Syringe Pump Analyzers"
04	Metrology in Acoustics, Ultrasound and Vibration	1	66 Hours	-	-	Foreign Online	Knowledge regarding "Acoustics, Ultrasound and Vibration"

අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව (පැය ගණන)	සමස්ත ආයෝජනය (රු '000)		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
05	Digital Transformation in Metrology Workshop "DCC for developer and its implementation in NQI"	1	18 Hours	-	-	Foreign	Knowledge regarding "developer and its implementation in NQI"
06	APMP EEFG International Workshop "Measurement for Sustainable Energy"	2	12 Hours	-	-	Foreign	Knowledge regarding "Measurement for Sustainable Energy"

වගුව අංක 26

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

7

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ අනුකූල වේ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ	මෙම දෙපාර්තමේන්තුවට අදාළ නොවේ.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අනුකූල නොවේ		
1.6	වෙනත් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අරමුදල	අනුකූල වේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3	විගණන ගිණුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.6	චෙක්පත් හා මුදල් ඇනවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල නොවේ	බැරකම් නොමැති නිසා ලේඛනයක් නඩත්තු කරනු නො ලබයි.	
2.11	උපපත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභි නියෝජනය කිරීම (මු.රෙ . 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම.	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (MBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
4.6	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (MBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.7	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලු ම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ . 134(2) DMA/1-2020 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ		අධ්‍යක්ෂ විසින් අදාළ අංශ ප්‍රධානීන්ට උපදෙස් දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලු ම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලු ම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2020 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල නොවේ	මෙම දෙපාර්තමේන්තුවට අභ්‍යන්තර විගණකවරයෙකු පත්කරන ලෙස ඉල්ලීම් කර ඇත.	අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. 2024 වර්ෂයේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවතී.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛනයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල වේ.		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින්, ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ.103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල නොවේ.	කල්බදු ක්‍රමය යටතේ වාහන මිලදී ගැනීම් සිදු කර නොමැත.	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර, ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල හෝ සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට, එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම.	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟ හිටි ණය පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ.	සේවය හැරගිය නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ අයකරගෙන නොතිබීම.	නීතිපති වෙත දන්වා ඇත. අදාළ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට තවදුරටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල නොවේ.	තැන්පත් ගිණුමේ ශේෂයක් නැත	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල නොවේ.	තැන්පත් ගිණුමේ ශේෂයක් නැත	
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකර තිබීම.	අනුකූල නොවේ.	දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය ආදායම් වැය ශීර්ෂයක් නොවේ.	

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල නොවේ.	දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය ආදායම් වැය ශීර්ෂයක් නොවේ.	
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ.	දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය ආදායම් වැය ශීර්ෂයක් නොවේ.	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා හෝ ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් හෝ වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදන කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ.	කාර්යසාධන ගිවිසුමක් ක්‍රියාත්මක නොවන අතර, ඇගයීම සඳහා ක්‍රමවේදයන් සකස් කර ඇත.	ඒ සම්බන්ධයෙන් කටයුතු කෙරෙමින් පවතී.
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

වගුව අංක 27